**2021 අගෝස්තු මස 05 වන දින පෙරවරු 9.30 ට මොරටුව මහා නගර සභා රැස්වීම් ශාලාවේදි පවත්වන ලද මොරටුව මහා නගර සභාවේ 2021 අගෝස්තු මස මාසික සභා රැස්වීමේ වාර්තාව**

**සහභාගීත්වය:-**

| | | | |
|---|---|---|---|
| 01. | නගරාධිපති | - | ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා |
| 02. | මහා නගර සභා මන්ත්‍රී | - | ජී.එම්.සුරංග නිශාන්ත අපෝන්සු මහතා |
| 03. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා |
| 04. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.තිලකසිරි ප්‍රනාන්දු මහතා |
| 05. | මහා නගර සභා මන්ත්‍රී | - | එච්.ප්‍රදීප් ශ්‍රියන්ත ප්‍රනාන්දු මහතා |
| 06. | මහා නගර සභා මන්ත්‍රී | - | එල්.ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා |
| 07. | මහා නගර සභා මන්ත්‍රී | - | ඒ.එච්.සුරේෂ් ඉන්දික මහතා |
| 08. | මහා නගර සභා මන්ත්‍රී | - | යූ.සුදත් ක්‍රිෂාන්ත පෙරේරා මහතා |
| 09. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී.ඩබ්.ඩී.රන්දු නිරෝෂණ මහතා |
| 10. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.නාලනී ප්‍රේමවතී ප්‍රනාන්දු මහත්මිය |
| 11. | මහා නගර සභා මන්ත්‍රී | - | පී.අශෝක ඉන්ද්‍රතිලක ප්‍රනාන්දු මහතා |
| 12. | මහා නගර සභා මන්ත්‍රී | - | පී.එම්.මහේෂ් රුක්මාල් ඩයස් මහතා |
| 13. | මහා නගර සභා මන්ත්‍රී | - | පී.යසන්ත රන්සිරි ප්‍රනාන්දු මහතා |
| 14. | මහා නගර සභා මන්ත්‍රී | - | එස්.ඩබ්.එම්.නිෂා ඉරානි විජේවික්‍රම මහත්මිය |
| 15. | මහා නගර සභා මන්ත්‍රී | - | කේ.ඩී.අනුර ප්‍රනාන්දු මහතා |
| 16. | මහා නගර සභා මන්ත්‍රී | - | යූ.ලලිත් ප්‍රනාන්දු මහතා |
| 17. | මහා නගර සභා මන්ත්‍රී | - | එස්.බේසර රවීන්ද්‍ර ප්‍රනාන්දු මහතා |
| 18. | මහා නගර සභා මන්ත්‍රී | - | එෆ්.බී.නිලංක සිල්වා මහතා |
| 19. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.කේ.පී සුසන්ත පෙරේරා මහතා |
| 20. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.ප්‍රිනිත් ක්‍රිෂාන්ත විජේරත්න මහතා |
| 21. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.පිලිප් ෆැන්සිස් ප්‍රනාන්දු මහතා |
| 22. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.ජයමාල් ශ්‍රියාරත්න මහතා |
| 23. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.බී.මල්ලිකා ජයවතී ප්‍රනාන්දු මහත්මිය |
| 24. | මහා නගර සභා මන්ත්‍රී | - | පී.ගාවින් මත්තෙස් මහතා |
| 25. | මහා නගර සභා මන්ත්‍රී | - | රවිනාත් ජයශ්‍රී ගුණසේකර මහතා |
| 26. | මහා නගර සභා මන්ත්‍රී | - | බී.සජිත් දුමින්ද පීරිස් මහතා |
| 27. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.තිසර රසාංජන මෙන්ඩිස් මහතා |
| 28. | මහා නගර සභා මන්ත්‍රී | - | යූ.අනුරසිරි ජයලාල් ද සිල්වා මහතා |
| 29. | මහා නගර සභා මන්ත්‍රී | - | ආර්.එම්.ඒ.දෝන දිලාශිනී මහත්මිය |
| 30. | මහා නගර සභා මන්ත්‍රී | - | යූ.ප්‍රසන්න මනෝජ් ප්‍රනාන්දු මහතා |
| 31. | මහා නගර සභා මන්ත්‍රී | - | ජී.එම්.නිරෝෂන් රුවමාල් අපෝන්සු මහතා |
| 32. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.සුදර්ශනි ප්‍රියන්ත්‍රිකා කුරේ මහත්මිය |
| 33. | මහා නගර සභා මන්ත්‍රී | - | මේරියන් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය |
| 34. | මහා නගර සභා මන්ත්‍රී | - | සිත්ති මසීනා බක්කර් මහත්මිය |
| 35. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මිය |
| 36. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.ශ්‍රියානි හේමලතා ප්‍රනාන්දු මහත්මිය |

| | | | |
|---|---|---|---|
| 37. | මහා නගර සභා මන්ත්‍රී | - | ආර්.ක්‍රිෂනි ප්‍රනාන්දු මහත්මිය |
| 38. | මහා නගර සභා මන්ත්‍රී | - | කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා |
| 39. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.පී.ප්‍රභාෂනි වික්‍රමසිංහ මහත්මිය |
| 40. | මහා නගර සභා මන්ත්‍රී | - | ඒ.එච්.සුදේෂ් ඉන්ද්‍රජිත් කුමාර මහතා |

සහ

නාගරික ලේකම් (වැ.බ.) - එම්.කේ.ඩී.තාරක මුණසිංහ මහතා

ගරු නගරාධිපතිතුමාගේ ආරාධනය මත වැඩ බලන නාගරික ලේකම් එම්.කේ.ඩී.තාරක මුණසිංහ මහතා විසින් 2021.08.05 වන දින මාසික සභා රැස්වීමේ නිවේදනය සභාවට ඉදිරිපත් කරන ලදි.

## 01. <u>වාර්තාව පිළිගැනිම හා සළකා බැලීම.</u>

2021.07.20 දින පැවති මාසික සභා රැස්වීම් වාර්තාව සලකා බැලීම.

<u>මහ නගර සභා මන්ත්‍රී - යූ.අනුරසිරි ජේ ද සිල්වා මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, ගිය සභාවේදි මම සඳහහන් කලා කල්දමුල්ල පාරවල් කිපයක් කැඩිලා කියලා ඒක මෙහි සඳහන් වෙලා නැහැ. එය වාර්තා ගත කරන්න කියලා ඉල්ලා සිටිනවා.

<u>මහ නගර සභා මන්ත්‍රී - ඒල්.ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා</u>

ගරු නගරාධිපතිතුමනි,2021.07.20 දින සභා රැස්විම් වාර්තාව ඉහත සංශෝධනයට යටත්ව පිළිගත යුතු යයි මා යෝජනා කර සිටිනවා.

මහා නගර සභා මන්ත්‍රී ජී.එම්.සුරංග නිශාන්ත අපෝන්සු මහතා විසින් ස්ථිර කරන ලදි.

ඒ අනුව 2021.07.20 දින පැවති මහ සභා වාර්තාව සංශෝධන සහිතව සභා සම්මත විය.

## 02. <u>ගරු නගරාධිපතිතුමාගේ නිවේදන</u>

**2(1)** <u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රිවරුනි, මහා නගර සභා මන්ත්‍රි සේනක දමයන්ත ද සිල්වා මහතාඅද දිනයේ සභාවට නොපැමිනෙන බව දන්වා එවා තිබෙනවා.

**2(2)** <u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රිවරුනි,ගරු නියෝජ්‍ය නගරාධිපති ඩී.සමන්ත සිල්වා මහතා අද දිනයේ සභාවට නොපැමිනෙන බව දන්වා එවා තිබෙනවා.

**2(3)** <u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රිවරුනි, මහා නගර සභා මන්ත්‍රි ඩබ්.මැක්සි ජේ ප්‍රනාන්දු මහතාඅද දිනයේ සභාවට නොපැමිනෙන බව දන්වා එවා තිබෙනවා.

**2(4)** <u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රිවරුනි, මහා නගර සභා මන්ත්‍රි ඩබ්.රවින්ද්‍ර රංගන ප්‍රනාන්දු මහතා අද දිනයේ සභාවට නොපැමිනෙන බව දන්වා එවා තිබෙනවා.

**2(5) <u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රිවරුනි, මහා නගර සභා මන්ත්‍රි එම්.කුමාර රාජරත්න මහතා මහතා අද දිනයේ සභාවට නොපැමිනෙන බව දන්වා එවා තිබෙනවා.

**2(6) <u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රිවරුනි, මහා නගර සභා මන්ත්‍රි සුනිල් නන්දසිරි මාසකෝරාල මහතාඅද දිනයේ සභාවට නොපැමිනෙන බව දන්වා එවා තිබෙනවා නිරෝධනය වෙමින් පවතින බැවින්.

**2(7) <u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රිවරුනි, මහා නගර සභා මන්ත්‍රි ඒ.දීපා චාන්දනී ආරියවංශ මහත්මිය අද දිනයේ සභාවට නොපැමිනෙන බව දන්වා එවා තිබෙනවා.

## 03. <u>සභාව අමතා ඒවන ලද ආයාචනා පෙත්සම් පැමිණිලි හා සන්දේශ සභාව හමුවේ තැබීම.</u>

**03(1) <u>මහ නගර සභා මන්ත්‍රි - යූ.අනුරසිරි ජේ ද සිල්වා මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, දැනට වසර 1 ½ පමණ සිටි කොවිඩ් වසංගත තත්වය ව්‍යාප්ත වන මොහොතේ මට දැන ගැනිමට අවශ්‍යයි නගර සභාවේ අංශ වල කොපමණ රෝගීන් සංඛ්‍යාවක් සිටිනවාද කියලා. හේතුව තමයි තම සේවා ඉටු කර ගැනිම සඳහා මහජනතාව විශාල වශයෙන් සභාවට පැමිනෙවා ඒ වගේම ගර්භනි නිලධාරින් හට අපි සහන සැලසිය යුතු වෙන අතර නිවසේ සිට වැඩ කරන ක්‍රමයක් ඇති කරන්න කියලා කියනවා.

**<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රිතුමා මේ වෙලාවේ මට අභවල් අය කියලා කියන්න අපහසුයි අපි වාර්තාවක් අරගෙන ගතයුතු පියවර ඒ අවස්ථාවේදිම ගන්නවා. උදාහරණයක් වශයෙන් කර්මාන්ත අංශයේ නිලධාරින් පොසිටිවු වුන අවස්ථාවේදි අපි ලඟම ආශිතයන් ඇන්ටිජන් පරික්ෂණයට යොමු කලා. ඒ අවස්ථාවේදි හඳුනාගත්තානම් ඒ අය නිරෝධානයට යොමු කරලා විෂබීජහරණය කරලා ආයතනය පවත්වාගෙන යනවා. ඔබතුමා කිව්වා හරි මෙහි සේවාව ලබා ගන්න අයගේ ආරක්ෂාව සලසන්න ඕන නිසා ඒ විදියට කටයුතු කරනවා. අපි පොසිටිව් වුන අයව තියාගෙන අනාරක්ෂිත භාවයක් ඇති කරලා නැහැ සභාවේ.

**03(2) <u>මහ නගර සභා මන්ත්‍රි - යූ.අනුරසිරි ජේ ද සිල්වා මහතා</u>**

ගරු නගරාධිපතිතුමා, මොරටුව කටුබැද්ද දසොයිසා ක්‍රිඩාංගනය අපේ සොයිසා මහත්මයා තෑගි ඔප්පුවක් විදියට තමයි ලබාදිලා තියෙන්නේ 1941.03.27 වන දින. මට කරුණු කීපයක් තියෙනවා දැනගන්න. මම පාසැල් යන අවධියේ පටන් ක්‍රීඩා කරලා තියෙනවා. නමුත් මේ ක්‍රීඩාංගනය අද වෙන කොට ජනතාවට එය පාවිච්චි කිරිමට බාධා පැමිණිලා තියෙනවා. මේ තෑගි ඔප්පුව සහ බිම්සවිය මැනලා තියෙනවා නම් සභාවට පවරා ගන්න ඒහෙම බැහැ කියන ඒක මම කියන්නේ.ඔප්පුව සම්බන්ධව මන්ත්‍රිවරුන් දැනුවත් කරන ලෙස ඉල්ලා සිටිනවා.

**<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රීතුමා, න්‍යාය පත්‍රයේ ප්‍රශ්ණ යටතේ ඉදිරිපත් කරන්න මම පිළිතුරු දෙන්නම්.

**<u>මහ නගර සභා මන්ත්‍රී - ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා</u>**

ගරු නගරාධිපතිතුමා, රීති ප්‍රශ්ණයක් මතු කරන්නේ අපි නියෝජනය කරන්නේ ලක්ෂ දෙකක ජනතාව නාගරික මන්ත්‍රියෙක් වෙනකොටම අපිට වගකීමක් තියෙනවා සභාවේ දේවල් ආරක්ෂා කරන්න. විශ්වාශ භංගයක් ගේන්න ඕන දෙයක් මේ අනුරසිරි මන්ත්‍රීතුමා කියන්නේ.සභාවේ දේපලක් සභාවට පවරා ගැනිම සම්බන්ධව ප්‍රශ්ණ කරනවා කියලා කියන්නේ මොන පදනමකින් ප්‍රශ්ණ කරනවද කියලා.

**03(3)** **<u>මහ නගර සභා මන්ත්‍රී - යූ.අනුරසිරි ජේ ද සිල්වා මහතා</u>**

ගරු නගරාධිපතිතුමා, මේ වෙනකොට නැවත ඩෙංගු ව්‍යාප්ත වෙමින් පවතිනවා. සභාව විසින් දැන් එය වලක්වා ගැනිම සඳහා අවධානය යොමු කරන්න කියලා ඉල්ලා සිටිනවා.

**03(4)**<u>**මහ නගර සභා මන්ත්‍රී - ඒ.එච්.සුදේෂ් ඉන්ද්‍රජිත් කුමාර මහතා**</u>

ගරු නගරාධිපතිතුමා, අපි දන්නවා නැවත වර්ධනය වෙමින් කොවිඩ් බරපතල තත්වයට එනවා. ඒවාගේම එන්නත් කරණයත් සැලකිය යුතු මට්ටමින් දැන් සිදුවෙමින් යනවා. ඔබතුමා මොරටුව බලප්‍රදේශයේ බලධාරියා ලෙසත් ඔබේ පාලනය නිසාත් තමයි මේ පැමිනිල්ල මම ඉදිරිපත් කරන්නේ. අද ලක්ෂපතිය උතුර ප්‍රදේශයේ ජනතාවට සයිනොෆාම් එන්නතේ දෙවන මාත්‍රාව ලැබිය යුතු දිනය.9.30 වෙනතෙක් අදාල නිලධාරින් අදාල ස්ථානයට පැමිණ නැහැ. සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලයෙන් මම විමසිම් කලවිට දැනගන්න ලැබුනේ එන්නත් මාත්‍රා තවමත් ඔවුන්ට ලැබි නොමැති බව.

**03(5)**<u>**මහ නගර සභා මන්ත්‍රී - ඒ.එච්.සුදේෂ් ඉන්ද්‍රජිත් කුමාර මහතා**</u>

ගරු නගරාධිපතිතුමා, ඒවගේම පසුගිය 1-2 දිනයන්හිදි බොරුපන සොයිසාපුර ප්‍රදේශ ගනනාවක් සයිනොෆාම් එන්නතේ දෙවන මාත්‍රාව ගුරු පල්ලියේදි දෙනු ලැබුවා. නමුත් සැලකිය යුතු පිරිසකට ලබා ගන්න බැරි වුනා. මගේ මවත් එතන හිටියා. සෞඛ්‍ය අංශ කියන විදියට නියමිත දිනයේදි එම එන්නත ලබා දිය යුතු බව කියනවා. මගේ පැමිණිල්ල මේ තත්වය පාලනය කරන්න ඕන කවුද? MOHඑකට අදාල එන්නත් ලැබෙන්නේ නැත්නම්, ලුනාව රෝහලට මේ තත්වය උදා වෙලා තිබුනා. හමුදාව මැදිහත් වෙලා එන්නත් කරන ස්ථාන යම් සැලකිය යුතු මට්ටමකට සිදු වෙනවා. මේ රාජ්‍ය සේවය හැල්ලු කිරිමකටද මේ යන්නේ. එම නිසා අපි ඉල්ලිමක් කරනවා ඔබතුමා බලධාරියා විදියට 3/2 බලයක් ඇතුලේ විධායක ජනාධිපතිවරයක් සිටියදි ඇයි මෙය විධිමත් කරන්නේ නැත්තේ. ජනතාව තව දුරටත් රස්තියාදු නොකර හැකි ඉක්මනින් මේ එන්නත් ලබාදිමට මැදිහත් වෙලා කරන්න කියන ඉල්ලිමක් කරනවා.

**<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රීතුමා, බොහොම ස්තුතියි තේරුම් ගැනිම පිළිබදව.

**03(6)** <u>මහ නගර සභා මන්ත්‍රී - ඒ.එච්.සුරේෂ් ඉන්දික මහතා</u>

ගරු නගරාධිපතිතුමා, මම පත්වුන අපහසුතාවයක් පිලිබඳව තමයි පැමිණිල්ල ඉදිරිපත් කරන්නේ.එන්නත් කරණය ඉතාම ප්‍රසස්ථ මට්ටමේ රටපුරා සිදු වෙනවා. යම් යම් ස්ථානවල පවතින ගැටලු තාවයන් නිසා අපි හැමෝටම ජනතාව ඉදිරියේ අසරණතාවයට පත්වෙනවා. පහුගිය දවස්වල කොවිෂීල් එන්නත විදින අවස්ථාවේ එගොඩඋයන,මොරටුව සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාල වල නම් කියවුනා ඒ අනුව පසුගිය දා පාන්දර 5.00 සිට මගෙන් විමසනවා. පසුව මට දැනගන්න ලැබුනා ඉන්ටනෙට් එකේ තියෙනවා කියලා. මොරටුවේ එන්නත් කරනය පිලිබඳව නගරයේ ප්‍රධානියා දන්නේ නැහැ. මහජන නියෝජිත්යෝ දන්නේ නැහැ. නමුත් විපක්ෂයේ සමහර අය දන්නවා. මේ ප්‍රශ්ණය මොරටුවේ විතරයි තියෙන්නේ. සමහර අය බොරදියේ මාලු බාන්න හදනවා. මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා කොවිඩ් කමිටුව කැඳවන්න. අදාල ක්‍රියාමාර්ග ටික ගන්න කියන ඉල්ලීම කරනවා.

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රිවරුනි, මේ සම්බන්ධයෙන් ගරු මන්ත්‍රිවරු දෙදෙනෙකුගේ අදහස අනුව සෞඛ්‍ය බලධාරියා විදියට කටයුතු කරන්නට උත්සහ ගන්න වෙලාවන්හිදි මේ මන්ත්‍රිවරු මේ අද ඉන්න තත්වයේ හිටියා නම්, මොරටුවේ මේ ප්‍රශ්ණය නැහැ. එදා බලධාරියා විදියට උත්සහාය ගන්න ගිහිල්ලා මම මෙයට අනවශ්‍ය උත්තර දෙන්නේ නැහැ හේතුව අනවශ්‍ය උත්තරයක් බලාපොරොත්තුවෙන් කවුරුහරි මේක කලාද කියලා මට පොඩි සැකයකුත් තියෙනවා. මොකද කවුරුත් කවදාවත් කටහඩක් අවදි නොවූ සෞඛ්‍ය බලධාරියා ඔබයි ඔබටයි බලය තියෙන්නේ කියන එක කියමින් අනවශ්‍ය දෙයක් මගෙන් ලබා ගැනිමට ලබාගන්න උත්සහයක් වෙනවාදෝ කියලා සැකයකුත් තියෙනවා අද වගේ දවසක.

නමුත් මම විශේෂයෙන්ම මේ අවස්ථාවේදි කියනවා සභාවක් විදියට කටයුතු කරන්න අපි පුරුදු වුනේ සභාවක පාලනය අපිට තිබූ කාලෙ නොවෙයි. මම නැවත නැවත කියනවා සභාවේ මන්ත්‍රීවරයෙක් විදියට පත්වී 2002 අප්‍රේල් මාසේ 17 වන දින දිවුරුම් දිමෙන් මම පටන් ගත්තේ සභාව කියන්නේ මගේ සභාව අපේ කියලා පටන් ගත්ත මම ගොඩක් දේවල් කරලා තියෙනවා විපක්ෂයෙන් ඉදලා. හැබැයි ඒවා සමහර තැන්වලදි විපක්ෂයට මතුවෙන්නේ නැහැ ඒකට දේශපාලන අරමුණක් නිසා.ඒනිසා සමහර තැන්වලදි සමහර මන්ත්‍රිවරු ගිහිල්ලා දොස්තරට එන්නත ගහන්නේ කොහොමද කියලා අහනවා. තව පැත්තකින් අහනවා දොස්තරට බෙත් ගෙනල්ලා දෙන්නේ නැත්තේ ඇයි කියලා අහනවා. හැබැයි කවුරුත් කිව්වේ නැහැ ගහන්නන් වාලේ ගහන එකවත් තෙරපි තෙරපි ගහන එකවත් ඒක කමක් නැහැ. එන්නත් කියලා පටන් ගත්ත අයත් ඉන්නවා. ඒ නිසා මේ සියල්ලටම උත්තර අධිකරණ ක්‍රියාවලියක් තියෙන නිසා මට උවමනාම උත්තරය දෙන්න බැහැ මේ වෙලාවේ. හැබැයි එකම දේ තමයි කවුරු කවුරුත් තේරුම් ගත්තා නම් මෙහි ප්‍රශ්ණය තියෙන්නේ අහවල් අහවල් අය අතර කියලා ඒක මම හිතන්නේ ප්‍රමාණවත්. අද දිනයේදි එන්නේ නැතුව එන්නත් ගහනවා කියලා කියලා තියෙනවා නම් කාට හරි, ඒ වරද කරලා තියෙන්නේ මොරටුව මහනගර සභාවේ අපි නොවෙයි. ඒක කරලා තියෙන අය ඒක බලාගත්තාවේ. මොකුත් නැතුව එතන දැන්වීමක් ගැහැව්වා නම් අද එන්නත් එන්නේ නැත කියලා අදාල බලධාරින් විසින් ඒක මගේ රාජකාරිය නොවෙයි. මගේ රාජකාරියක් කරන්න

ගන්නකොට ඔය හයිය තිබුනා නම්, ඔබතුමාට බැරි නම් ඔබතුමා කියන්න අපි හරි මැදිහත් වෙන්නම් කියලා කියන කටින්ම දැන් මට කියනවා නම් ඔබතුමා මේක වගකියන්නේ කියලා හරි පාපයක්.ඒක නිසා එතනින් එහාට මට මේකට උත්තර දෙන්නත් විදියක් නැහැ.

නමුත් සෞඛ්‍ය බලධාරියාගේ කාර්ය කිරීමට හෙටටත් මම පසුබට වෙන්නේ නැහැ. පසුබට නොවන්නේ වෙන මුකුත් නිසා නොවෙයි, එකක් සෞඛ්‍ය බලධාරියා අනික තුනෙන් දෙකක ආණ්ඩුවක් හදාගෙන මේ ආණ්ඩුව ජනතාවට වැඩ කරන්න බැදිලා ඉන්නවා. ඒක අතපසු කිරීමක් කරන්නේ නැහැ මට තියෙන කණගාටුව ප්‍රමාද වෙලා මේක කියන්න පටන් ගත්ත නිසා අශ්වයා ගිහිල්ලා ස්ථාලය වහගන්න වැයමක ඉන්නවාදෝ කියලා මට සැකයක් තියෙනවා. මෙතනින් ඒහාට මම මුකුත් කියන්නේ නැහැ සැප්තැම්බර් මාසේ 3 වන දින අධිකරණ ක්‍රියාවලියක් තියෙන නිසා. ඒකම දේ තමයි ඔය කියන මිනිස්සු ගැන හිතන අයට අද දිනයේ එන්නත් කරන්නේ නැහැ කියලා කියන්න තිබුනු අය නිහඬ වෙලා සිටීම පිලිබදව මම හරි කණගාටු වෙනවා ඇරෙන්නට මට මගේ යටතේ කරන්න ඉතුරු වෙලා නැහැ. මට කරන්නට තියෙන ඒකම දේ තමයි එන්නත්කරණයට පහසුකම් ඉල්ලනකොට පුටු,ටෙන්ට්,ලබා දෙනවා පීසීආර් කරන්න කියනකොට වාහන ඉල්ලුවම වාහන දෙනවා මොන පැත්තකට වත් අඩුවක් වෙලා නැහැ හෙටත් ඒක වෙනවා අඩුවක් වෙන්නේ නැහැ දෙපැත්තටම ඒ කාර්ය කරනවා.

**03(7 )**<u>මහ නගර සභා මන්ත්‍රී - කේ.ඩී.අනුර ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමා, ගියමාසේ 3 වෙනිදින ඒන්නත් කලා කටුබැද්ද ප්‍රදේශය සොයිසාපුර නිවාස වලට. මම කලින් දින වෛද්‍යතුමියට කථා කරලා ඇහුවා ඔබතුමිය කටුබැද්ද ප්‍රදේශයට ඒන්නත් ලබාදෙන්නේ කවදද කියලා. කියන්න බැහැ කියලා කිවුවා. මටත් ගහගන්න බැරි වුනා. මම විහාරමහදේවි පාක් ඒකට ගිහිල්ලා තමයි ඒන්නත් කර ගත්තේ.ඊට පහුවෙනිදා වෛද්‍යතුමාට කථා කරලා ඇහුවම කියනවා. ඔබතුමාට මොකටද අපි කියන්නේ කියලා. මේක නගරාධිපතිතුමනි කුමන්ත්‍රනයක්.ඔබතුමාට කථා කරන්න අයිතියක් නැති වෙන්න පුලුවන් අධිකරණ ප්‍රශ්ණයක් නිසා. දැන් හැමෝටම මතක් වෙලා ඔබතුමා සෞඛ්‍ය බලධාරියා කියලා මොරටුවේ. ඒදා කියනවා නැහැ කියලා. වෛද්‍ය වරයා කියනවා ඔබතුමාට කිය කිය ඉන්න අපිට අවශ්‍යතාවයක් නැහැ කියලා.ගමේ මිනිස්සු අහන්නේ අපෙන්.සමහර අය දන්නවා.මගේ පියාට අවුරුදු 94 යි.මම කථා කලාම කියනවා ක්‍රමයක් නැහැ ඒන්නත දෙන්න කියලා.ඇම්බියුලන්ස් නැහැ කිවුවම මම නගරාධිපතිතුමාගෙන් ලබා දෙන්නම් කියලා කිව්වම නැහැ නැහැ අපි නගරාධිපතිතුමා සමඟ ඒහෙම කරන්න අපි කැමති නැහැ කිව්වා. වෛද්‍යවරු අද උදේ ප්‍රකාශ කරපු දෙයක්. මේකෙන් වෙන්නේ රජය අපහසුතාවයට පත්වෙනවා. ඒන්නත් ලබා ගන්න බැරි සෞඛ්‍ය වෛද්‍ය කාර්යාලයකින් වැඩක් නැහැ මොරටුවට. මේ ගැන ඉහල තැන් වලට හරි දැනුම් දිලා මේ රථගාල හමුදා මධ්‍යස්ථානයක් හරි කරලා ඒන්නත් කරණය කරන ස්ථානයක් කරලා හරි මොරටුවේ අසාධාරනය වුනු ජනතාවට ඒය ලබා දෙන්න. මම කථා කරන්නේ ජනතාව වෙනුවෙන් මොරටුව ඒම්.ඕ.ඒච් කාර්යාලයෙන් වැඩේ කෙරෙන්නේ නැහැ.

<u>මහ නගර සභා මන්ත්‍රී - ජී.එම්.නිරෝෂන් රුවමාල් අපෝන්සු මහතා</u>

ගරු නගරාධිපතිතුමා,මේ වෙලාවේ මෙහෙම කථා කරන්න පුලුවන්ද

-සභා ඝෝෂා-

**<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු නිරෝෂන් මන්ත්‍රීතුමා, මේ මන්ත්‍රීතුමාට සිදු වුනු කාරණයක් ගැන කථා කරන්න මම අවසර දුන්නේ. මම කවුරුවත් වෛද්‍යවරුන්ව විවේචනටය ලක් කරන්නේ නැහැ. මට ඒහෙම අවශ්‍යතාවයක් නැහැ.නමුත් නීෂා මන්ත්‍රීතුමිය මගේ මන්ත්‍රීවරියක්.ඒතුමිය පොසිටිව් වුන වෙලාවේ පොසිටිව් වුනු ගෙය ඉදිරිපිට තියාගෙන මේ මන්ත්‍රීතුමියගේ ගෙදර සිටින සියලුම දෙනාව බස් රථයේ දාගෙන ගිහිල්ලා මේ මන්ත්‍රීතුමියට සිදු වුනා භාරලක්ෂ පනස්දාහක් වියදම් කරන්න. ඔය කථා කරපු මන්ත්‍රීතුමාගේ අයියාගේ ගෙදරට සිදුවුනා ලක්ෂ 5 ක් වියදම් කරන්න. ඔය වෛද්‍යවරිය ඇවිල්ලා බලෙන් අරගෙන ගියා.හැබැයි ඒතකොටත් නිවසේ නිරෝධානය වෙන්න පුලුවන්. හැබැයි ඒ මොහොතෙම අහවල් තැනක බෙහෙත් විදිනවා රෝගීන් දෙදෙනෙක්ව ඇතුලේ තියාගෙන. මේවා කථා කරන්නේ නැහැ අපි. නමුත් ඒ මන්ත්‍රීවරයා වේදනාවෙන් කාථා කරන්නේ වෙන මුකුත් නිසා නොවයි අපි ගෙදර ඉන්නම් අපිට ප්‍රශ්ණයක් නැහැ කියද්දි නිෂා මන්ත්‍රීතුමියගේ ගෙදර අයව කුදලාගෙන ගිහිල්ලා දැම්මා. ඒවැනි තත්වයක් නිර්මානය වෙලා තියෙනවා.ඒහෙම තියෙද්දි ඒන්නත් කරනය කරනවා ඒතන පොසිටිව් වෙලා තියෙද්දි. මේවා මාධ්‍ය වල ගියා. මෙතන කවුද හරි කියන ඒක නොවෙයි මොකක්ද හරි කියනතැනට යන්න. ඒක විපක්ෂය වෙන්නත් පුලුවන් මට වෙන්නත් පුලුවන් කවුද හරි කිය කිය බැලුවොත් අපිට වරදිනවා. රවිනාත් ජේ ගුණසේකර මැතිතුමාගේ කාලේ කවුද හරි කියන ඒක නොවෙයි මොකක්ද හරි කියන ඒක දැනගෙන තමයි අපිඋදව් කලේ.ඒක අපි කලා. විවේචන ඕන තරම් මට තියෙන්නත් පුලුවන්.මට තියෙන එකම දේ තමයි පැත්ත වෙනස් වුනාම තමන් බලන්නේ මොකක්ද හරි කියන නොවෙයි කවුද හරි කියන ඒක විවේචනය කරන්න පටන් අරගෙන තියෙන්නේ. මේක කොයි වෙලාවක හරි නවතින්න ඕන. නැවතුනාම අපි කාටකාටත් පොදුවේ අපි සියලු දෙනාටත් සෙතක් ශාන්තියක් වෙයි.

**03(8 )** **<u>මහ නගර සභා මන්ත්‍රී - ඒම්.ලිහිනි ප්‍රනාන්දු මහත්මිය</u>**

ගරු නගරාධිපතිතුමා,මටත් කොරෝනා සම්බන්ධයෙන් යමක් ප්‍රකාශ කරන්න තියෙනවා. අපි සියලු දෙනාම මෙතන ඉන්නේ වගකීමක් සහිත මහජන නියෝජිතයින් කියලා. අපි දන්නවා ඔබතුමා කොරෝනා පලවෙනි රැල්ල දෙවනි රැල්ල කොරෝනා කමිටු පිහිටුවලා ඉතාමත් වගකිම සහගතව කටයුතු කලා. හරි දේට අපි හරි කියනවා. ඒන්නත් කිරිමේදි අපහසුතා වලට පත්වුනා ඒ සම්බන්ධයෙන් ඔබතුමා ප්‍රකාශ කලා. නමුත් අපිත් මහජන නියෝජිතයින් විදියට අපහසුතාවයට අසරණතාවයට පත් වෙනවා ජනතාව අපෙන් යම්කිසි දේවල් ඇහුවම.ඩෙල්ටා ප්‍රභේදය පැතිරෙන අවස්ථාවක අපි ඉන්නේ. මෙතන අපි දෙපැත්තට බෙදිලා චෝදනා ඉදිරිපත් කරන්නට පුලුවන්. නමුත් මේවායින් කිසිසෙතක් වෙන්නේ නැහැ.කොරෝනා අවසන් වෙන්නේත් නැහැ. අපි බුද්ධිමත් පිරිසක් විදියට මීට වඩා මේ දේවල් දිහා සාධනීයව බලන්න ඕන. මම කාටවත් චෝදනා කරන්න නොවෙයි යෝජනා ටිකක් ඉදිරිපත් කරන්න කැමතියි. කොරෝනා ව්‍යාප්ත වෙන අවස්ථාවේ ජනතාවට යන්න රෝහල් නැහැ. පුද්ගලික රෝහල්වලට ආර්ථිකමය වශයෙන් යන්නත් බැහැ.අපි දකිනවා ඊයේ කරාපිටියෙ රත්නපුරේ හදිසි රෝහල් තත්වයට පත්කරලා. අපි දන්නවා ඩෙල්ටා ප්‍රබේදය මොරටුවේ ව්‍යාප්ත වෙලා කියලා. අපිට මෙතන අතරමැදි රෝහල් හදන්න රජයෙන් අවසර දිලා නැහැ. නමුත් අපි මෙතන කොරෝනා කමිටුවක් පත් කරලා ඔබතුමාගේ ප්‍රධානත්වයෙන් අපි සාධනීය තීරණ ඒ අවස්ථාවේදි ගත්තා. මම මේ වෙලාවේ

ඉල්ලීමක් කරනවා පක්ෂ/විපක්ෂ හැටියට ඒකතුවෙලා ඒ වගේම මොරටුවේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරින් එකතු වෙලා මේ කොරෝනා තත්වය මෙතනින් එහාට ගියොත් මොනවද අපි ගන්න පියවර සම්බන්ධයෙන් සාකච්ඡා කරමු කියලා යෝජනාවක් ඉදිරිපත් කරනවා.

**03(9 )** <u>මහ නගර සභා මන්ත්‍රී - ඒම්.ලිහිනි ප්‍රනාන්දු මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමා,දෙවනි ඒක අපි දන්නවා මෙතන වෛද්‍ය වරුන්ගෙන් MOH එගොඩඋයන MOH මොරටුව අතර යම්කිසි ප්‍රශ්ණ තිබුනා නගර සභාව අතරත් ප්‍රශ්න තිබුනා හැබැයි මම ගියා MOH කාර්යාල වලට බලන්න මම දැක්කා ඒ කාර්යාල වල පහසුකම් වල තියෙන අපහසුතාවයන්. සමහර අයට කබඩ් නැහැ බෙහෙත් දා ගන්න තැනක් නැහැ ඒ වගේ ප්‍රශ්ණ තියෙනවා මම හිතනවා සභාවක් හැටයට මේ සෞඛ්‍ය තත්වය සලකා බලලා ඒ පහසුකම් දෙන්න පුලවන් නම් කලයුතුයි කියලා මම යෝජනවාවක් ඉදිරිපත් කරනවා.

**03(10 )** <u>මහ නගර සභා මන්ත්‍රී - ඒම්.ලිහිනි ප්‍රනාන්දු මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමා, මම කියන්න කැමතියි මොරටුවේ තාවකාලික රෝහල් ඇති කරන්න පුලුවන්ද, ඔක්සිජන් අවශ්‍යතාවයක් ඇති වුනොත් තාවකාලික රෝහල් ඇති කරන්න පුලුවන්ද ලුනාව රෝහලට අමතරව. හේතුව ඉදිරි මාසය ඇතුලත මරණ සංඛ්‍යාව හාරදාස් පන්සීයයි. ඒක්ලක්ෂ විසිදාහකට යනවා කියලා ගනන් බලලා තියෙනවා. නගර සභාවක් විදියට අපේ ජනතාව බේර ගන්න ඒක අපේ රටේ ප්‍රතිපත්ති තියෙන්න පුලුවන් නමුත් අපිටත් යම්කිසි ප්‍රතිපත්තියක් තියෙන්න ඕන කියලා මම විශ්වාස කරනවා. ඒ සම්බන්ධයෙන් මහජන නියෝජිතයෝ හැටියට අපිට කටයුතු කරන්න පක්ෂ විපක්ෂ බේදයකින් තොරව මැදිහත් වීමටත් අපිට වගකීමක් තියෙනවා කියලා. ඒ වගේම ගර්භණී කාන්තාවන් ගැන කථා කරනවා නම් මොරටුව මාතෘසායන වල සිටින පවුල් සෞඛ්‍ය සේවිකාවන්ට ඔබතුමා නියෝගයක් කරන්න කියලා මම ඉල්ලීමක් කරනවා මොරටුවේ ගර්භනි කාන්තාවන් ගැන සොයා බලා වාර්තාවක් සභාවට ඉදිරිපත් කරන්න කියලා. ඔවුන්ට කොවිඩ් හැදිලා තියෙනවද මොකක්ද ඔවුන්ගේ තත්වය මොකක්ද ඔවුන්ව ආරක්ෂා කරන්න අරගෙන තිබෙන පියවර කියලා. දරුවන් සම්බන්ධයෙන් අද ළමා රෝහලේ දරුවන්ව ගිහිල්ලා දාන්න හැකියාවකුත් නැහැ ඒතන ළමයි 500 ක් ඉන්නවා කොවිඩ් හැදිලා අපේ මොරටුවේ වැල්ල පැත්තේ සිටින දුප්පත් අසරණ ළමයින්ට කොවිඩ් හැදුනොත් මොකක්ද අපි ගන්න ක්‍රියා මාර්ගය. මගේ සීමිතදැනුම අනුව මම දන්න දෙයක් තමයි කොරෝනා හැදුනත් ලක්ෂණ නැති රෝගින් ඉන්නවා ඒගොල්ලන්ට තාවකාලිකව බේත් දෙන්න පුලුවන් අපේ මොරටුවේ ඉන්නවා නම් ඒ වගේ රෝගීන් බේත් දීලා අපට පුලුවන්ද ඒ අයව බලාගන්න. මේ වගේ සාධනිය පියවර වෙනුවෙන් මම හිතනවා සභාවක් හැටියට අපි කටයුතු කන්න ඕන. මෙතන අපි ඉදිරිය බලල කටයුතු කරන්න ඕන මෙතුමන්ලට කාටවත් අපි චෝදනා කරලා තෙරුමක් නැහැ ඒ අනුව මම ඔබතුමාට කියනවා අපේ තිබුනු කොරෝනා කමිටුව නැවත කැඳවන්න අපිත් එන්නම්.

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමිය, කොරෝනා කමිටුව නමත් වෙනස් කරලා ඩෙංගු කමිටුව එක්කම හැම සිකුරාදාම කැඳවනවා. අවාසනාවකට MOH කාර්යාලයකින් දෙකටම එන්නේ නැහැ.

<u>මහ නගර සභා මන්ත්‍රී - ඒම්.ලිහිනි ප්‍රනාන්දු මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමනි, අපි දන්නවා මෙතන MOH කාර්යාලයත් ඒක්ක දේශපාලන ප්‍රශ්ණයක් තියෙනවා කියලා ඔබතුමාත් අතර. ඒවා සම්බන්ධයෙන් කථා කරලා තියෙනවා අපි මේ තිබෙන වර්තමාන තත්වය සලකා බලලා රාජ්‍ය නිලධාරින් සියලුම දෙනා මැදිහත් වෙලා වැඩ කරන්න ඕනෑ.

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රිතුමිය, බාධා කරනවා නොවෙයි,ඊයෙත් මොරටුවේMOHකාර්යාලයෙන් ලිපි දෙකකට අත්සන් කරලා දුන්නා.ගිය සඳුදාත් ලිපි තුනකට අත්සන් කරලා දුන්නා. මගෙන් පහසුකම් ගන්න ලිපි එවනවා මම දෙනවා. එහෙම ගනුදෙනු අඩුපාඩුවක් නැහැ ඒවා කෙරෙනවා. මම අත්සන් කරන හැම ලිපියකම ෆොටෝ කොපියක් තියෙනවා. මේ වෙන කථාවක් මේ යන්නේ.

<u>මහ නගර සභා මන්ත්‍රී - ඒම්.ලිහිනි ප්‍රනාන්දු මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමනි, මගේ ඉල්ලිම මෙපමණයි මේ තත්වය තවදුරටත් ව්‍යාප්ත වුනොත් රෝගීන්ව ආරක්ෂා කරගන්න මොනවද අපි කරන්න කියන සම්බන්ධයෙන් අපි සාකච්ඡාවක් කල යුතුයි කියලා මම යෝජනා කරනවා.

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රිතුමිය, මම සියලුම මන්ත්‍රිවරුන්ට කියනවා අපි ඩෙංගු එක්කම කොවිඩ් එකත් අරගෙන සෞඛ්‍ය කමිටු සභාපතිතුමාගේ ප්‍රධානත්වයෙන් අපි සෑම සිකුරාදාම රැස්වීම් තියනවා. ගිය සිදුරාදා රැස්වීමට ඒගොඩඋයන MOHකාර්යාලයෙන් වෛද්‍යවරයෙක් ආවා. ඩෙංගු කොවිඩ් දෙකම ඒකතු කරලා රැස්විම පවත්වාගෙන යනවා. මොකද මේක පොදුවේ ඩෙංගු කමිටුව තියනවා වගේම තව අවුරුද 10-15 මේ කොවිඩ් තියෙයි කියලා.ඒක නැති වෙන්න පුලුවන්.තියෙයි කියලා හිතාගෙන රැස්විම් තියනවා. ඒකට සහභාගි වෙන්න.

**03(10)** <u>මහ නගර සභා මන්ත්‍රී - ඒම්.තිසර රසාංජන මෙන්ඩිස් මහතා</u>

ගරු නගරාධිපතිතුමනි,ඇත්ත වශයෙන්ම කියනවා නම් මේ වෙනකොට කොවිඩ් හතර වන රැල්ල පටන්ගෙන තත්වයක් තියෙන්නේ. කොවිඩ් රෝගියෙක් ගෙදර ඉන්නවා නම් ඇම්බියුලන්ස් ඒක ඇවිල්ලා ඒ රෝගියාව රෝහලකට ගෙනයන ඒ යාන්ත්‍රනය සම්පුර්ණයෙන් ඇන හිටලා තියෙන්නේ. මේ වෙනකොට ඔබතුමාත් දන්නවා මගේ නැන්දනිය මේ වෙනකොට ඉතාම අසනීප තත්වයෙන් ඉන්නේ ඒයාට පිලිකාවකුත් තියෙනවා. මේ ඇම්බියුලන්ස් ප්‍රශ්ණය උඩ ඒයාගේ පුතා උත්සහා කරනවා රෝගියාව ප්‍රයිවට් වාහනයකින් රෝහලකට ගෙනියන්න ඒකටත් අවසර ගන්න ඕන සෞඛ්‍ය බලධාරින්ගෙන්.සභාවක් විදියට අපෙත් යුතුකමක් තියෙනවා ඔබතුමාගෙත් මීට වඩා මැදිහත්විමක් මේකට ලබාදෙන්න උත්සහ කරන්න කියලා ඉල්ලා සිටිනවා.

**03(11 )**<u>මහ නගර සභා මන්ත්‍රී -ඒම්.තිලකසිරි ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, මේ එන්නත්කරණය ගැන කථා කරනකොට ඉදිබැද්ද නියෝජනය කරන මන්ත්‍රිවරයා විදියට ප්‍රශ්ණ තියෙනවා.පලවෙනි මාත්‍රාව ලබා දිලා තියෙන්නේ දෙවන මාත්‍රාව දෙන

දිනයක් නිශ්චිතව නැහැ. අපි තමයි මහජනතාව ඉදිරියේ අපහසුතාවට පත්වෙන්නේ.ඒ සම්බන්ධව අපිට ඉල්ලිම කරන්න වෙන්නේ දේශපාලන අධිකාරිය විදියට ගරු ඔබතුමාගෙන්.

**<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රිතුමා,වෛද්‍ය රංග සමඟ මම දුරකථනයෙන් කථා කරනවා.ඒතුමා කථා කරන නිසා යම් යම් දේවල් ගොඩක් සිදු කලා. නමුත් අවාසනාවකට මම කථා කලාම කථා කරන්නේ නැත්නම් මම මොකද කරන්නේ. විල්ලෝරාවත්තේ දෙවන මාත්‍රාව දෙන්න ගිහිල්ලා 500 කට විතර අඩු වුනා. ජනතාව මට දිගින් දිගටම බණිනවා. මම දන්නේ නැහැ මෙම ක්‍රියාවලිය කොතනින්ද ඉවර කර ගන්නේ කියලා. අපි ලොකු උත්සහායක් ගමු වෛද්‍යවරුන් සමඟ සුහදශිව මේ කටයුත්ත බේර ගන්න.

## 03(12) <u>මහ නගර සභා මන්ත්‍රි - ඒම්.තිලකසිරි ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, දැන් ඩෙංගු රෝගය ව්‍යාප්ත වෙමින් පවතිනවා. ජනතාව කියනවා දුම ගැසීමෙන් මෙය යම් කිසි මට්ටමකට පාලනය කරන්න පුලුවන් කියලා. ඒය ඉටු කරන්න කියලා ඉල්ලිම කරනවා.

## 03(13) <u>මහ නගර සභා මන්ත්‍රි - ඒම්.තිලකසිරි ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි,ඒ වගේම දැන් මාස ගනනවක් තිස්සේ ඉදිබැද්ද 208 බස් රථය ගමන් කරන්නේ නැහැ. ගමන්කරන බස් රථ රාත්‍රි 7-8 වෙනකොට ධාවනයෙන් නවතිනවා. ඒ නිසා ජනතාව අපහසු තාවයන්ට පත්වෙනවා. ඒම නිසා ගරු නගරාධිපතිතුමනි ඔබතුමා මැදිහත් වෙලා මෙය ඉටුකර දෙන මෙන් ඉල්ලා සිටිනවා.

## 03(14) <u>මහ නගර සභා මන්ත්‍රි - ඒම්.තිලකසිරි ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, ඉදිබැද්ද මගේ ප්‍රදේශයේ ඉතාමත් අවදානම් තත්වයේ පස් බැම් කීපයක් තියෙනවා. මිට කලින් මේ අවදානම් පස් බැම් නිසා ඒකම පවුලක ජීවිත 3 ක් අහිමි වුනා කියලා ඔබතුමා දන්වා නගරාධිපතිතුමනි. වසර ගනනාවක් තිස්සේ මේ අවදානම් තත්වයත් ඒක්ක සෝදා පාලු වෙලා දැන් අඩියක පමණ පරතරයක් තමයි නිවස හා පස් බැම් අතර තියෙන්නේ. ඒමනිසා ඉදිබැද්ද ජනතාවගේ ජිවිත් අහිමි වෙන්න පුලුවන්. වසර ගණනාවක් තිස්සේ වර්ෂා කාලයේදි ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ පැමින ආරක්ෂිත ස්ථාන කරා යන්න කියලා කියනවා පමණයි නිශ්චිත ස්ථාන ලබා දෙන්නේ නැහැ ඒ අයට ඉවත් වෙන්ව. ඔබතුමා මැදිහත් වෙලා රජය හා කථාකරලා ඉක්මනින් මේ අයට විසඳුමක් ලබා දෙන්න කියලා කාරුණිකව ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

**<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රිතුමා, මේ කාරණයේදි ව්‍යාපාරික ස්ථාන විදියට පවත්වාගෙන යන්නට අංශක 90 ට පස් කපපුස්ථාන දෙක්ක තියෙනවා ඉදිබැද්දේ. අදම මේ සභාව ඉවර වුනාට පසුව ප්‍රධාන මහජන පරික්ෂක මහතා සමග කමිටුවක් ගිහිල්ලා ස්ථාන පරික්ෂාවක් කරලා පලමුව ව්‍යාපාරික බලපත්‍රය අහෝසි කරන්න. ඔහුට නිර්නායකයන් දෙන්න අදාල වන දිනත් ඒක්ක මෙතන ආරක්ෂාව

සපයන්න කියලා. වැඩ කිරිම නතර කරලා පොලීසිය දැනුවත් කරලා සම්පූර්ණයෙන්ම සීල් කරන තත්වයට පත් කරලා ව්‍යාපාරය නතර කරලා ඒ කටයුත්ත කරන්න අවශ්‍ය කටයුතු කරන්න.

**03(15)** <u>මහ නගර සභා මන්ත්‍රී -කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, වරිපනම් ලේඛණයේ නම් වෙනස් කිරිමට අදාලව මහජනතාව සැලකිය යුතු ලෙස රස්තියාදු කරන, පීඩාවට පත්වෙන තත්වයට අද පත්වෙලා තියෙනවා ඒ සඳහා පැමිණෙන ජනතාවට නගර සභාවෙන් කියනවා පලාත් ආදායම් කොමසාරිත් ගේ සීල් ඒක අවශ්‍යයි කියලා. ඒතකෙට ඒම තැනැත්තා ඒම ස්ථානයට ගියාම ඒතනින් දෙනවා රැගෙන ආ යුතු යම් ලේඛණ ප්‍රමාණයක්. පසුව කියනවා අදාල පරිදි මුද්දර ගාස්තු ගෙවා නැහැ කියලා. ඒම නිසා ගරු නගරාධිපතිතුමනි පලමුව පැමිණෙන්නේ මේ අය නගර සභාවට අපිට අවබෝධයක් තියෙනවා කියන්න මෙන්න මේ ලියවිය රැගෙන යන්න කියලා.

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රිතුමා, ඔබතුමාට බාධා කරනවා නොවෙයි. ඔතන සම්පූර්ණ වරද කරන්නේ නොතාරිස් මහත්වරු කරන්න ඕන පිලිවෙල කරන්නේ නැති නිසා. පළමුව නොතාරිස් මතය විමසලා ඒතන සිටින තක්සේරු නිලධාරි මතය විමසලා ඒ අනුව තමයි ලියන්න ඕන ඔප්පුව.ඒකට තමයි ගාස්තු අය කරන්නේ.ඒ සියලු කටයුතු කරලා සීල් ඒක ගහලා ගෙන්වා දිම තමයි නොතාරිස් මහත්මයාගේ වගකීම.ඒ වගකීම  නොතාරිස් මහත්මයා නොකරන තැන තමයි මේ ප්‍රශ්ණ මතුවෙන්නේ.

<u>මහ නගර සභා මන්ත්‍රී  - කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, මම කියන්නේ ඒ අදාල විස්තර ඇතුලත් දැන්විමක් අලවා තිබෙනවා නම් මේ රස්තියාදුව පිඩාව මහජනයාට සිදු වෙන්නේ නැහැ කියන ඒක. අනිත් ඒක ඒ ක්‍රියාවලියෙම අදාල AT අයදුම්පත අත්සන් කරන්නේ අදාල පැටිකියට යොදලා නීතිඥ මහත්මයෙක්. එසේ සහතික කරපු මේ ලේඛණ මේ ආයතනය පිලිගන්නේ නැහැ. මෙහෙන් කියනවා තව දරුවො ඉන්නවද කියලා දන්නේ නැති නිසා නැවත කියනවා සාම විනිසුරු හරහා දිවුරුම් පෙත්සමක් ගේන්න. මම කියන්නේ මේක බරපතල ප්‍රශ්ණයක්.සාමවිනිසුරු වරයෙක් පාවිච්චි කර ගන්න ඕන නැහැ මේ රටේ පිලිගත්ත නෛතික බලයක් තියෙන නීතිඥ වරයෙක් සහතික කලාම. මම හිතනවා අපි ව්‍යවස්ථාපිත ආයතනයක් ඒක නිසා උචිත නොවන දෙයක්.කොමසාරිස්තුමා මේ තීන්දුව ගත්තේ කවුද?

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රිතුමා,නමක් හැරවීමේදි දිවුරුම් පෙත්සම් කීපයක් ඉදිරිපත් කරන්න වෙන්න පුලුවන්.නම අතර වෙනසක් වෙන්න පුලුවන්. බුදල් බෙදිමක් වෙන්න පුලුවන් විවිධ විවිධ ඒවා ඒන්න පුලුවන්.

<u>මහ නගර සභා මන්ත්‍රී  - කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි,අවසානයේ ඔබතුමාගේ තීන්දුව තමයි ක්‍රියාත්මක වෙන්නේ.

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමා, මගේ තීන්දුවක් නොවෙයි මේ කියන්නේ.

<u>මහ නගර සභා මන්ත්‍රී - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, නමක වෙනසක් තියෙනවා නම් සාමවිනිසුරු සහතිකය හරි. නමුත් දරුවෙක් ඇතුලත් කරලා නැත්නම් සාමවිනිසුරු සහතිකය අපිව ආරක්ෂා කරන ඒකක් නොවෙයි.

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමා, සමාවෙන්න මම මේ ඔබතුමාට වැරැද්ද නිවැරදි කරන්න හදන්නේ. සාමවිනිසුරු කෙනෙකුට කාගෙවත් අයිතියක් ගන්න බැහැ.ඒ කියන ඒක මගේ ඉදිරියේදි කියවා අත්සන් කරන ලදි. කවුරුවත් සාමවිනිසුරු කෙනෙක් වගකීමක් ගන්නේ නැහැ. ඔබතුමා පටලවාගෙන තියෙන්නේ.

<u>මහ නගර සභා මන්ත්‍රී - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි,ඒහෙම නම් ඔබ ඒකක් කියනවා ආයතනය ඒකක් කරනවා.මම සාමවිනිසුරු සහතිකයක් දුන්නා ඒ පිලිබඳව.දරුවන්ගේ නම් ටික දාලා. ඒක පිලිගත්තේ නැහැ.

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමා, ඒක ප්‍රශ්නෙත් ඒක්ක පස්සේ කතා කරමු. සභාවත් ඒක්ක සාමවිනිසුරු සහතිකය කියන්න බැහැ. ඔබතුමා නොදන්නවා වුනාට ඉහල අධිකරණයට යන්න වුනොත් ඒ ගෙනියන ඒක සාමවිනිසුරු කෙනෙක් විසින් සහතික කරන්නේ නැත්නම් නඩුව ඉදිරියට ගෙනියන්න බැහැ.

**03(16)** <u>මහ නගර සභා මන්ත්‍රී - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, මට කොමසාරිස්තුමා ලියාපදිංචි තැපැලෙන් ලිපියක් ඒවනවා මන්ත්‍රීවරුන්ගේ ඉන්ධන හා මුද්දර දීමනා සම්බන්ධ අධිභාර ගත මුදල් අයකර ගැනිම. අවසානයේ කියනවා මගේ පංගුවේ රු.භාරලක්ෂ අනුදෙදහස්පන්සිය අනුතුනයි ශත අනුතුනක් මට ගෙවන්න කියලා. ගරු නගරාධිපතිතුමනි මේ සභාවට යම් මොහොතක වුනු විශාල වරදක්. ඒ වරදට දායක වුනු මන්ත්‍රීවරු වගේම නිලධාරින් කථා කරලා ඕන තරම් තීන්දු තිරණ අරගෙන තියෙනවා.මීට අදාලව හිටපු කොමසාරිස්වරයෙක් මට ලිපියක් ඉදිරිපත් කරලා තියෙනවා ඒ මුදල ඔබ ගෙවා අවසන් කියලා. ඒ ලිපිගොනු වල තියෙනවා සියලු විස්තර. තවත් අයට නීතිමය කටයුතු කලා.

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමා,ඔය වෙන ඒකක් , මටත් ඒක අදාලයි. මන්ත්‍රීවරු කීදෙනෙක් ඉන්නවා. අපි ගිය සභාවෙදි යෝජනාවක් සම්මත කරලා අදාල වෙන්නාවු කටයුතු කරමින් පවතිනවා. මේ ප්‍රශ්නයේදි නිලධාරින්ව නිදහස් කලා සේම අපිවත් නිදහස් කරන්න කියලා අපි යෝජනාවක් සම්මත කර ගත්තා.

**03(17)** <u>මහ නගර සභා මන්ත්‍රී - බී.සජිත් දුමින්ද පිරිස් මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, මේ වෙනකොට ඒන්නත් කරණය සාර්ථකව සිදුවෙමින් පවතිනවා. පසුගිය මරණ වලින් ඒන්නත් ලබා නොගත්ත අයත් ඒක ඒන්නතක් ලබා ගත්ත අයත් තමයි වැඩිපුර සිටින්නේ. ඒ වගේම අවුරුදු 18-30 ත් අතර අයට ඒන්නත් ලබා දිමක් සිදු කරන්න යනවා. මෙම ඒන්නත් ලබා දි ජනතාව බේරා ගැනිම ඉතා වැදගත්.

## 03(18) <u>මහ නගර සභා මන්ත්‍රී - බී.සජිත් දූමින්ද පිරිස් මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, පීසීආර් කිරිමේදි සතියකට වරක් පමණයි කරන්නේ. කවුරු හෝ රෝග ලක්ෂණ පෙන්වනවා නම් අපිට ඒ වාරය ඒනකම් ඉන්න සිදු වෙනවා. මේ වෙනකොටත් රෝගි තත්වයේ සිටින අය ඉන්නවා නිවෙස් තුල. මේක ක්‍රමවත්ව ඉටු කිරිම සඳහා පහුගිය කාලේ ඔබතුමාත් ලොකු උත්සහයක් ගත්තා. මගේ දායකත්වයත් ලබා දුන්නා. නගරාධිපති සමන්ලාල් ප්‍රනාන්දු ගන්න හැම තීන්දුවකට ම අපි ඒකඟයි.

<u>මහ නගර සභා මන්ත්‍රී - බී.සජිත් දූමින්ද පිරිස් මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, අපි අන්තර් නිරෝධායන මධ්‍යස්ථානයක් පිහිටුවන්න කියලා අපි ඉල්ලික් කලා. අපි කථා කරපු කාරණාව දැන් උච්චස්ථානයට පැමිණ තියෙනවා. රෝහල් ධාරිතාව ඉක්මවලා පැමින තියෙනවා. ඒ වගේම ගැබිණි මව්වරුන් ගේ මාතෘ සායන මූලිකත්වය ගෙන සංවර්ධන කටයුතු කරමින් ඒ ආපදා තත්වයන් යුහුසුලු වන ආකාරයෙන් ඒ උපාය මාර්ග තෝරා ගනිමින් කටයුතු කිරිම වැදගත් වෙනවා. ඒ වගේම කොවිඩ් ප්‍රශ්ණයත් ඒක්කම අසරණ වෙච්ච කණ්ඩායම් කිපයක් ඉන්නවා. කොවිඩ් හේතුවෙන් ආදායම් මාර්ග අහිමි වෙනවා වගේම ප්‍රාදේශිය ලේකම් කාර්යාලවල ලියාපදිංචි වුනු අය ඉන්නවා ශිෂ්‍යාධාර ලබන දරුවන් ඉන්නවා. මේ පවුල් දැනට 66 ක් ඉන්නවා. අපිට පක්ෂ විපක්ෂ භේදයකින් තොරව ඒ පවුල් 66 වෙනුවෙන් රු.1500/- ක් වගේ බඩු මල්ලක් දෙන්න පුලුවන් කම තිබුනා. මම අවධාරණය කරන්නෙ නගර සභාව මට්ටමනුත්මේ අසරණ වුණු මිනිස්සුන්ට යම් ක්‍රියාමාර්ගයක් ගන්න කියන ඉල්ලිම කරනවා.

<u>මහ නගර සභා මන්ත්‍රී - බී.සජිත් දූමින්ද පිරිස් මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, මම පහුගිය කාලේ මතක් කලා අපේ මහජන සෞඛ්‍ය පරික්ෂක මහත්වරු 8 දෙනෙකුත් අපේ පවුල් සෞඛ්‍ය සේවිකා 12 දෙනෙකුටත් දිමනා පලවෙනි මාසේ ලැබිලා තිබුනා ඒ වගේම හිග දිමනාත් තියෙනවා ඒවා ලබා දිමටත් කටයුතු කරන්න කියන ඉල්ලිම මම කරනවා.

## 03(20) <u>මහ නගර සභා මන්ත්‍රී -එම්.ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමනි,මා වෙත ලැබුනු පෙත්සමක් ඉදිරිපත් කරන්නේ. ඉදිකරමින් තිබෙන කාණු පද්ධතියක් සම්බන්ධව. මොරටුමුල්ල 5 වන පටුමග ආවරණය වන පරිදි මෙම කාණු පද්ධතිය සෑදිම සහා 2021 සිට ආරම්භ කර ඇති බවත් ප්‍රදේශවාසින් විදිය අපි ඒ සම්බන්ධව ප්‍රිතිමත් වන බවත් ඒ ආයතනයට ස්තුතිමත් වන බවත් ඔවුන් සඳහන් කරනවා. ඒත් ඒක්කම ඔවුන්ට යම්කිසි බලපෑමක් සම්බන්ධව පැමිල්ලක් ඉදිරිපත් කර තිබෙනවා.මෙම සංවර්ධන කටයුත්ත කිසියම් කණ්ඩායමකට ප්‍රතිලාභයක් අත්වන අතර ඒතනින් කිසියම් පිරිසකට යම්කිසි අගතියක්

සිදුවෙනවා නම් ඒම ව්‍යාපාතිය තුල යම් කිසි අසාර්ථක භාවයක් ඇති වේදෝ කියන සැකයෙන් ජනතාව සිටිනනිසා ඔබතුමාගේ අවධානය යොමු කරන ලෙස ඉල්ලා සිටිනවා.

**04.** **<u>ප්‍රශ්ණ</u> -** නැත

**05.** **<u>යෝජනා</u> -** නැත.

## 06. <u>2021ජුලි මස ස්ථාවර කමිටු වාර්තා සලකා බැලීම.</u>

### 06(1) 2021.07.26 දින පැවති පරිසර සෞඛ්‍ය සනීපාරක්ෂාව පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ තීරණයන් සලකා බැලීම.

<u>මහ නගර සභා මන්ත්‍රී - ඒ.ඒච්.සුදේශ් ඉන්ද්‍රජිත් කුමාර මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, කමිටු වාර්තාවේ අංක 2(5) කරුණ යටතේකොමසාරිස්තුමා විසින් සභාතිතුමා වෙත ඒවන ලද ලිපියෙ කියවද්දි අපිට ගැටලු ගණනාවක් මතුවෙනවා මෙහි සඳහන් වෙනවා කෝටි 2 1/2 ක පමණ මුදලක් සම්බන්ධව නිරවුල් භාවයක් ඇති කර ගැනිමට සාකච්ජා කර තීරණයක් ගත යුතුයි කියලා. මේ හිඟ මුදලක් සම්බන්ධව තමයි තියෙන්නේ. මේ වාර්තාවට අනුව මේ මුදල සඳහන් වුනාට පසුගිය ජුලි 26 වන සඳුදා දින ලංකාදිප පුවත්පතේ පලවෙන මේ වාර්තාව පිලිදව කියවා බැලුවම ඉතාම බරපතල කාරණයක් කියවෙනවා. ඒකේන් අපිට අදාලයි කෝටි 5 ක මුදලක් ගෙවන්න තියෙනවා කියලා තමයි ඒ ආයතනය බාර නානායක්කාර මහත්මයා සඳහන් කරන්නේ.ඒ මාධ්‍යවේදිනිය ඔබෙන් ප්‍රශ්ණයක් අහනවා ඒකට අදාලව ඔබ ප්‍රකාශයක් නිකුත් කරන්නේ නැහැ. අපිට දැන් ගැටලුවක් මතුවෙනවා මේ තත්වය පිලිබඳව නිවැරිදි දත්තයන් කිසිවක් අප සතුව නැහැ. අපි කසල අංගනයක් පැවැත්වුවා. නමුත් ඒහි නිවැරදි දත්ත කිසිවක් සභාවට ලැබිලා නැහැ. ආරම්භ කරලා මාස 6 කට වැඩියි. ඒ පිලිබඳ කිසිම තත්වයක් පිලිබඳව ඒහි ලබන ආදායම ඒ යන්ත්‍රසුත්‍රවල තත්වය , වියදම් කරපු ප්‍රමාණය මේ සභාවට ඇවිල්ලා නැහැ. ඒක බරපතල තත්වයක්. ඒ නිසා අපිට ප්‍රශ්ණයක් තියෙනවා මේ දිර්ඝ ලිපිය ඇතුලෙත් කරුණු ගණනාවක් ඉදිරිපත් වෙනවා. මේ පිලිබඳව අපිට තවදුරටත් අධ්‍යනය කරන්න සිදුවන නිසා අපි කියන්න කැමතියි මේ කසල ව්‍යාපෘතිය සම්බන්ධයෙන් ගරු නගරාධිපතිතුමනි යම් යම් ප්‍රශ්ණ භූමිය තුල තියෙනවා. අපි වියදම් කරල ඉදිරිපත් කරපු පත්‍රිකාවේ දිගින් දිගටම සඳහන් වෙනවා සතියට දින දෙකක් නොදිරණ කසල ඒකතු කරනවා. කොහේවත්

ඒහෙම ගන්නේ නැහැ. ඒකේ තාක්ෂණික කරුණු තියෙන්න පුලුවන්. අපිට ප්‍රශ්ණයක් තියෙනවා සොයිසා පුර ඇතුලු මේ කසල ඒකතු කිරිම පිලිබඳව ගැටලු ගණනාවක් තියෙනවා. අපි හොඳ ව්‍යාපෘතියක් අපි ආරම්භ කලා ව්‍යාපෘතිය ගැන ගැටලුවක් නැහැ. ව්‍යාපෘතියේ ඇත්ත ප්‍රතිපලය ජනතාවටත් සභාවටත් ලැබෙන පරිදි ක්‍රියාමාර්ග සිදු වෙනවද කියන ගැටලුව අපිට තියෙනවා. රැට රැට කුණු පුච්චනවා පරිසරය ට හානි සිදුවෙනවා ඒ මගින් ඒ වගේම අපි කථා කලා ඩෙංගු ව්‍යාපෘතිය පිලිබඳව. ඔබතුමාගේ රූපවාහිනී වැඩ සටහනකදි අපේ සෞඛ්‍ය පරික්ෂක තුමා හරි කතාවක් කිවුවා ඉතාම හොඳින් මේ කටයුත්ත සිදු වෙනවා දැන් මොරටුවේ අතේ ඇඟිලි ගනනටවත් මොරටුවේ ඩෙංගු රෝගීන් නැහැ කියලා මාසෙකට කලින් කිව්වා. අපි දැන් කරුනු සොයා බැලුවම දැන් මාස දෙකකට පස්සේ බැලුවම 88 දෙනෙක් වාර්තා වෙනවා මොරටුවේ. අපි සංදර්ශන පැවැත්තුවට වැඩක් නැහැ සමාජය තුල ඇත්ත තත්වය ඒක නොවෙයි නම්. ඒම නිසා මේ කසල ව්‍යාපෘතිය සාර්ථක කර ගන්න කල හැකි උපරිමය කල යුතුයි. නැත්නම් ඒහි විපාකය මොරටුව ජනතාවට විදින්න සිදු වෙන්නේ. පසුගිය කාලය තුල යම් යම් කරුණු හේතුවෙන් මඟ හැරෙන්න ඇති. නමුත් දැන් කාණු පුරාවට ඩෙංගු මදුරු කීටයන් පිරිලා.තවමත් ඒවා නිසි පරිදි පිරිසුදු වෙන්නේ නැහැ. මේ තත්වය පාලනය කර ගන්න ඔබේ පාලනය අසමත් බව තමයි අපට පෙනි යන්නේ. ඩෙංගු ප්‍රශ්ණය මොරටුවේ දැන් බරපතල ප්‍රශ්ණයක් බවට පත්වෙලා.අපි ඉල්ලා සිටිනවා මේ ඩෙංගු ප්‍රශ්ණය කොරෝනා වලට ඒහා යන්න කලින් විසඳුම් ලබා දෙන්න කියන ඉල්ලිම අපි කරනවා.

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රිතුමා, කථා කරන්න පුලුවන් වෙන්නේ ඒක තැනකින්නේ. ඔබතුමා අවසාන කරපු තැනින් තමයි මට පටන් ගන්න වෙන්නේ. බෝවෙන්නාවූ ඕනෑම රෝගයක් වසංගතයක් සම්බන්ධයෙන් කටයුතු කරන සෞඛ්‍ය බලධාරියා මා වුනාට තොරතුරු ලබා දෙන බලධාරියා වනනේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි වරයා. ඒකට ක්‍රියාත්මක කිරිමේ බලධාරියාත් සෞඛ්‍ය බලධාරියා විදියට මගේ වගකිම තියෙනවා. ඔබතුමා නොදන්නවා ඇති ඔබතුමා යන වේගය අඩු කරලා ඔය යන වේගය හොඳයි යන විදියෙ තමයි වැරැද්ද තියෙන්නේ. ඒකට හේතුව තමයි ඔබතුමා ඔය විවේචනයට ලක් කරන කාල සීමාව ගත්තම අපි ඕක පටන් ගත්තේ ජනවාරි 12 වනදින. කරදියාන වත්තේ අපිට කියනවා අවශේෂ වන්නාවූ නොදිරන කසල ගේන්න ඒපා කියලා. ඔබතුමත් දන්නවා මමත් දන්නවා දැන් මාස 2 ½ ක් මේක නවත්තලා. මේක ඇඳගන්න බැරුව නවතිනවා. නවතිනකොට ප්‍රශ්ණ ඇතිවෙනවා. කසල සතියක් ඇද්දේ නැති වුනොත් ඒක නිවැරදි කර ගන්න සති හතරක් යනවා. අපි ඒක නිවැරදි කර ගැනිම සඳහා ඊයේත් සාකච්ජාවක් කලා. ඒ සාකච්ජාවෙදි මට ලැබුන දෙය තමයි සොයිසා පුර පුන පුනා කියන නිසා දෙන දේ ඒ විදියටම ගන්න කියලා පොඩි අදෝනාවක්, මැසිවිල්ලක්, බලපෑමක් කරන මන්ත්‍රිවරුත් ඉන්නවා කියලා සොයිසාපුර. මම කිව්වා දෙන විදිය ඒ විදියටම ගන්නබැහැ. හේතුව ඔබතුමන්ලා නොදන්නවා ඇති මේ සියලුම මන්ත්‍රිවරුන්ගේ ගෙවල් වලිනුත් මේවා තෝරලා තමයි දෙන්නේ. තොර්ලා නොදි ඉන්න බැහැ. තෝරලා නොදෙන අය පුච්ච පුච්ච කියනවා වේවා ගෙනියන්නේ නැහැ කියලා. මට හෙට සිට ඒනවා ඒ පිලිබඳ වාර්තාවක් කුණු නොතෝරා දෙන අය කවුද? ඒ අයගේ ලිපිනය මොකක්ද? ඒ කුණු මල්ල පවා මම කියලා තියෙන්නේ වීඩියෝ කරන්න කියලා. මොකද අපි කෙනෙකුට දෝෂාරෝපනයක් කරනකොට අනිත් පැත්තට බලන්න ඔබ මේ දෝෂාරෝපනය කරන විදිය විද්‍යාත්මකද කියලා. ඒහෙම නැත්නම් කුණු අදින සේවකයා ඩෙංගු තියාගෙන කොරෝනා තියාගෙන කුණු අදින ඒක කරනකොට අපි කාටවත් තේරෙන්නේ නැහැ යම්යම් වෘත්තින් වල ඉන්න අය ඒලියට බැහැල කැහැ ගහනකොට කාටවත් තේරෙන්නේ නැහැ

මේ අහිංසක සේවකයෝ සතියක් වර්ජනයක් කලොත් කොරොනා නොවෙයි ඊටත් වඩා භයානක රෝග හැදෙනවා. මේ අහිංසක සේවකයන් පිලිබඳ කථා කිරිමේදි මීට වඩා වගකීමක් ගන්න.මීට වඩා අවබෝධයෙන් කථා කරන්න. සේවකයා කියන්නේ ඔහුට තියෙනවා රාජකාරියක් ඔහුට තියෙනවා වැඩ කරන්න ලැයිස්තුවක් ඔබතුමාගේ ඔය නොකෙරුනා කියන වැඩය මම කියන්නේ නැහැ කෙරුනා කියලා. ඒතනට මම යන්නේ නැහැ. ඒකට හේතු තියෙනවා වැඩියෙන්ම ඔයකුණු ගොඩවල් නැති කරන්න මම තරම් කැමති මගේ ආණ්ඩු පක්ෂය තරම් කැමති නැහැ ඔබතුමන්ලා. කැමති නම් ඔබතුමන්ලා ඔය යෝජනාව මට ගෙන්නේ නැහැ. ඔබතුමා ඔය යෝජනාව ඔයිට වඩා හොඳින් ගේනවා.ඔබතුමා කැමති නැහැ කුණු නැති වෙනවට. කුණු තියෙනවට ඔබතුමා කැමති. ඒකට හේතුවක් තියෙනවා එතකොටයි විවේචනයක් තියෙන්නේ. අපි ඒකට ආස නැහැ. අපිට ඕන මේක නැති කරන්න. නැති කිරිමේ කටයුත්ත අපි ඉතාමත් විදිමත් කරනවා. මේ දවස්වල රටේ තියෙන තත්වයත් ඒක්ක අපේ මේ වෙනකොට සෞඛ්‍ය කම්කරුවන් සහ කර්මාන්ත කම්කරුවන් 70 කට වැඩියේ පුරප්පාඩු වෙලා තියෙන්නේ. මියගිය, විශ්‍රාම ගිය, සේවය අතහැර ගිය මේ පුරප්පාඩු සංඛ්‍යාව තියාගෙන තමයි අපි මේ වැඩේ කරන්නේ.අනිත් පැත්තෙන් ගත්තම මේ තරම් වත් මේ සේවාව සිදු කරන්නේ මොරටුව මහ නගර සභාව විතරක්ම විතරයි මේ සේවකයන්ට මේ විදියට සලකන්නේ. අනිත් අය සේවකයන්ට මේ විදියට සලකන්නේ නැහැ. ඒ නිසා අපි දැන් කලාප තුල සේවකයන්ව මාරු කිරිමක් කරලා ගරු මන්ත්‍රීවරුත් ඒක්ක මම සාකච්ජාවක් කරලා මොකක් හෝ වැඩ සටහනක් කරලා මේක නිවැරදි දිශාවකට ගෙනියන්න යන්නේ. ඔබතුමා කිව්වා හරි. කොරෝනා තිබුන කාලේ අපි කාණු පිරිසිදු කලේ නැහැ. වෙන හේතුවක් නිසා නොවෙයි මිනිස්සු පාරේ යන ගමන් මාක්ස් ඒක දාගෙන කෙල ගහන්නේ නැහැ. මාක්ස් ඒක ගලවලා කෙල ගහන්නේ රෝගියා. කෙල බිඳිති වලින් තමයි රෝගය හැදෙන්නේ. ඒතකොට තණකොට කපනකොට කෙලබිඳිති ස්පර්ෂ පෙන්න පුලුවන්. ඒක නිසා කරන්න වාලේ කරන්නයන්න බැහැ. ඒක විද්‍යාත්මකව අපිට ලැබෙන තොරතුරුත් ඒක්ක. මම ඔබතුමාට ඉතාමත්ම ඕනෑකමින් කියනවා සුදේශ් ගරු මන්ත්‍රීතුමා පුලුවන්නම් වෛද්‍යාවරියට කියන්න කොරෝනා වලට කරපු දේ ඩෙංගු වලට කරනනේ නැතුව කවුරු හෝ පි ඒච් අයි කෙනෙක්වත් ඒවන්න කියලා ඩෙංගු රැස්විමට හේතුව තමයි වෙන මුකුත් නොවෙයි ඔවුන්ගෙන් ලැබෙන තොරතුරු අනුව තමයි අපිට පුලුවන් වෙන්නේ ඩෙංගු මැඩපැවැත්විම සඳහා කරන්නාවූ පරික්ෂණ, දුම් ගැසීම් කරන්න වෙන්නේ. ඒ තොරතුරු අපිට ඒන්නේ නැහැ. ඒ තොරතුරු ඒන්නේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලට. ඒම නිසා ඔබතුමා මට දැන් මේ කියනවා වගේම කියන්න ඔබතුමිය නගරාධිපතිතුමා සමඟ ප්‍රශ්ණයක් තිබුනට අපිට අදාල නැත. ඔබතුමිය අදාල වෙන්නාවූ තොරතුරු දෙන්න ගිහිල්ලා. මම මහජන නියෝජිතයෙක් විදියට ඔබතුමිය වගකියන්න. මේක කියන්න මේක කියන්නේ නැතුව ප්‍රශ්ණය ඒක පැත්තකට ඇඟිල්ල දික් කලා කියලා, ඔබ බලාපොරොත්තු වන මහජන සේවාව මම බලාපොරොත්තුවන මහජන සේවාව වෙන්නේ නැහැ. හැබැයි ඒතනට ගිහිල්ලා දෙන්න එපා තොරතුරු. ඒක එයාගේ වැඩක් කියලා කියන්න යන්න එපා. එතකොට මේක මහජන සේවයක් වෙන්නේ නැහැ. අපි ඔතන ඉඳලා ඕක කලේ නැහැ. ඒහෙනම් රවිනාත් මහත්මයා යන්න කලින් අපි ගිහිල්ලා වෛද්‍යාවරයා සමඟ කථා කරන්නේ. එහෙම කරන්න බැහැ කියලා අපි ගිහිල්ලා කථා කරනවා. ඒක නිසා කරුණාකරලා මම ඔබතුමාලට විරුද්ධ නැහැ. මේක කෙරෙන විදිය කථා කරන දේවල් අපි මේ පරිසරයේ තියෙන දේවල් අපි දන්නවා. ඒක නිසා කරුනාකරලා මේක යනකොට ඔබතුමා තාම වාර දෙකයි ධුර ලබා ගත්තේ එම නිසා දන්නේ නැහැ.

මේ කසල කලමනාකරණය අවිදිමත් වුනා මේ කොරෝනා නිසා. ඒ නිසා තමයි මේ ඩෙංගු අවේ කියන ඒක අපි කියනවා. අපි සේවකයන් කැඳවලා කිව්වා නැවත වතාවක් පොලිතින් පිච්චෙන්න බැහැ, කොළ පිච්චේන්න බැහැ. ඒ පුච්චන අය සම්පූර්ණම වගකියන්න වෙනවා. ඒතකොට අතිකාල ,දිරි දීමනා නැති වෙයි. සම්පූර්ණවම මේ කසල ටික මෙතනට ගේන වැඩ සටහන හදන්න කියලා. ඔබතුමාට බොහොම ස්තුතියි. හැබැයි ඔබතුමා ඔය කියන දේ මීට වඩා සත්භාවයෙන් ඉදිරිපත් කිරිම කරන්න. මම ඔබතුමන්ලා කියන දේවල් ඇහුම්කම් නොදෙන්නේ නැහැ. බොහෝ සේ ඇහුම්කම් දිලා තියෙනවා. හෙටත් ඇහුම්කම් දෙන්න බලාපොරොත්තු වෙනවා. විශේෂහෙන්ම ජනතා විමුක්ති පෙරමුණ සිටින මන්ත්‍රීවරු කියන දේවල් බොහෝ සේ ඇහුම්කම් දෙන්න උත්සහ ගන්නවා. එහෙම කලා කියලා ඔබතුමන් ලා ඒක දන්නවා.හැබැයි මෙතනදි නැවත වතාවක් වෛද්‍යවරයාගෙන් අයින් කරලා මට විතරක් ගහන්න හදන්න ඒපා. වෛද්‍යවරයාගෙන් ගන්න පුලුවන් ඒක ගන්න බැරි වෙනවා. වෛද්‍යවරයට ගහ ගහා මටත් ගහන්න කමක් නැහැ. වගකීමෙන් වෛද්‍ය වරුන්ට අයින් වෙන්න දෙන්න ඒපා. වෛද්‍යවරයාට සුදුහුනු ගාන්න යන්න ඒපා.

වෛද්‍යවරු දෙපලගෙන් ඒක්කෙනෙක් දැන් ඒනවා.වෛද්‍යවරයෙක්ව සහභගී කරවනවා. ඩෙංගු ගැන, කොරෝනා ගැන කථා කරනවා. ඒක නිසා මේක අපිට ඉවර කර ගන්න ඕනෑ. අපිටත් හදාගන්නත් බැහැ. මිනිසුන්ට හැදෙන්න දෙන්නත් බැහැ. ඒ වෙනුවෙන් පෙනි සිටින්න ඒක වරක් නොවෙයි දහස් වරක් කැමති නිසා තමයි අපිට අතරමැදි රෝහලක් නැති වුනාට ලිහිනි මන්ත්‍රතුමිය මට කථා කර කර කියනාවා ඔබතුමා රෝගින් නගර සභාවේ නතර කර ගන්න ඒක ඉතා ප්‍රවේශමෙන් කරන්න මට කියපු වාර අනත්තයි. රවිනාත් ජේ ගුණසේකර මැතිතුමා මට කියපු වාර අනන්තයි. අපි ඒහෙම කලෙත් අපිට තේරුනා මේක මානසිකව බලන දේත් ඒක්ක මේ අය මඩකලපු ගියාම ඒතන ඉදලා මානසිකත්වයත් ඒක්ක ඉක්මනින්ම සුව වෙන්නේ නැති නිසා ඕන කමක් තිබුනා මොරටුවේ සිටින කෙනා මොරටුවේම තියලා ඒ නිරවුල් මානසිකත්වය හදන්න. ඕනෑම රෝගයකට තමන්ට ඔලුවට දැනෙන බරත් ඒක්ක රෝගය මොන තරම් පවතිනවද නැද්ද කියන රෝගයක් හැදුන කෙනෙක් දන්වා. මටත් ඒහෙම රෝග හැදිලා තියෙනවා. යම් යම් තැන්වල මම ඉදලා තියෙනවා ඒ තැන්වලදි ඒක දැනිලා තියෙනවා. ඒල්ලිලා මැරෙන්න අනන්ත හිතිලා තියෙනවා. ඒ නිසා මොරටුවේම හිර ගෙයක් තිබුනා නම් මට ඒක උදාවෙන්නේ නැහැ මම ඉන්නේ මොරටුවේ කියලා හිතෙන නිසා. ඒක නිසා මම කරන්න ගිය දේට මට ආණ්ඩුවෙන් ඒක කරන්න ඒපා වගකීමක් ගන්න ඒපා කියපු නිසා දැනටත් ඉන්වා 7-8 දෙනෙක්. ඒකට හේතුව තමයි මේ වෙනකොට සම්පූර්ණයෙන්ම අමාරු නොවන රෝගින්ව ගෙවල් වල ඉදිලා ප්‍රතිකාර ගන්න පුලුවන් නම් ප්‍රතිකාර ගන්න කියන ඒක නිවේදන නිකුත් කරලා ඉවරයි වෛද්‍යවරුන්ට උපදෙස් දිලා ඉවරයි.ඒක නිසා අපි ඒකකරනවා.

සුදේශ් මන්ත්‍රතුමා ඔබතුමාට ගෞරවනීය ස්තුතිය පුද කරනවා. මේකට ලෙන්ගතු වෙච්ච ඔබගේ සහයෝගය ලබාදෙන්න. හැබැයි අවසානයේ ඔබතුම කිව්වනේ මේකත් කොරෝනා කරගෙන වෛද්‍යවරයා ඒකක තියෙන අමනාපකම් ඒක්ක ඩෙංගු කොරෝනා මට්ටමට ගේන්න ඒපා කියපු ඒකමම අතිශායින්ම ප්‍රතික්ෂේප කරනවා. මේකේ නිසි බලධාරියාගේ කියන්නේ ,සෞඛ්‍ය බලධාරියා කියන්නේ මුකුත් නොවෙයි ගන්න ඕන තීන්දු ටික අරගෙන කරන්න මම වෛද්‍යවරයෙක් නොවෙයි. ඒ උපදෙස් අනුව ක්‍රියාත්මක කිරිම විතරයි මට කරන්න පුලුවන්. ඔබ අද සභාව ඉවර වුනාම ගිහිල්ලා කියන්න කරුනාකරලා ඔයගොල්ලන්ගේ ප්‍රශ්ණ තියාගන්න මම ඒක නගරාධිපතිටත් කිව්වා ඒ ප්‍රශ්ණ තියාගන්න ඒහෙම හැබැයි ඔබතුමිය අනිවාර්යයෙන්ම රැස්වීම් වලට ඇවිල්ලා ඩෙංගු වල, කොරෝනා වල වාර්තාවල් දෙන්න ඒතකොට බෝවීම

වලක්වා ගන්න නගරාධිපතිතුමා වැඩ කලේ නැත්නම් අපි ඊලඟ සභාවේදි නගරාධිපතිතුමාට කියන්නම් කියලා ඔබතුමා කියන්න. ඔබතුමාට ඒක කියන්න අයිතියක් තියෙනවා. ඒම නිසා ගරු මන්ත්‍රීතුමා නැවත වතාවක් මගේ පැත්තට විතරක් මේ බෝලේ දාන්න ඒපා. මම බෝල බාර ගන්න අකමැති කෙනෙක් නොවෙයි බෝල බාරගත්ත වාර අනන්තයි අප්‍රමාණයි හෙට දිනයේදිත් ගන්න ඕන මම පරිපාලකයෙක් නිසා. ඒම නිසා ඔබතුමාගේ විවේචනය සාධාරණයි හැබැයි අවසානයේ කියපු ඒක මම ඉතාමත්ම පිලිකුලෙන් ප්‍රතික්ෂේප කරනවා. මට ලැබෙන උපදෙස් අනුව හැම දේම කල හැකි නායකත්වය දෙන්න පුලුවන්.

<u>මහ නගර සභා මන්ත්‍රී - ඒ.ඒච්.සුදේශ් ඉන්ද්‍රජිත් කුමාර මහතා</u>

ගරු නගරාධිපතිතුමනි,ඔබේඅදහස් පිලිබදව වැරදි වැටහිමක් හැදෙන නිසාම අපි කසල පාර පුරා වැටෙනවට කැමති අය නොවෙයි. අපි විශාල උත්සහයක් දරනවා විපක්ෂයේ ඉදලත් ඒකට අදාල ක්‍රියා මාර්ග තෝරන්න. පුද්ගලිකව මම මගේ ගෙදර කසල කොලකෑල්ලක් වත් ඒලියට ගෙන්නේ නැහැ. මම ඒක වෙන් කරලා කරනවා.

-සභා ඝෝෂා-

<u>මහ නගර සභා මන්ත්‍රී -යූ.ප්‍රසන්න මනෝජ් ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, මොරටුව මොල්පේ පොදු වෙලද පොලේ කුණු සම්බන්ධව ප්‍රශ්ණයක් තියෙනවා. මම මේ සම්බන්ධව කොමසාරිස්තුමා දැනුවත් කලා. බදු ප්‍රශ්ණයක් තියෙනවා කියලා මම දන්නවා.

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමා, ඒ සම්බන්ධව පියවර අරගෙන තියෙන්නේ.

<u>මහ නගර සභා මන්ත්‍රී - යූ.ප්‍රසන්න මනෝජ් ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි,බොහොම ස්තුතියි.ඒවගේම ඩෙංගු මරධනය ට මා විසින් යෝජනාවක් ගෙනාවා ඩෙංගු සම්බන්ධ උපකරණයක් ගැන.ඒ පිලිබදව ඉදිරියේදි සෞඛ්‍ය කමිටුව විදියට ගන්න ක්‍රියාමාර්ගය මොකක්ද කියලා දැනගන් කැමතියි.

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රිතුමා, සොඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලයේ ඉන්නවා කීට සම්බන්ධ විශේෂඥවරු ඔවුන්ගෙන් වැඩියෙන්ම කීටයන්ඉන්න තැන මොකක්ද සුදුසු තැන මොකක්ද කියලා ඒ වාර්තාව ලැබුන ගමන් අපි කරනවා.

**2021.07.26 දින පැවති පරිසර සෞඛ්‍ය සනීපාරක්ෂාව පිළිබද ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම තීරණ ඒකමතිකම සභා සම්මත විය.**

**06(2) 2021.07.26 දින පැවති ආයතන හා නීතිය පිළිබද ස්ථාවර කමිටු වාර්තාවේ තීරණයන් සලකා බැලීම.**

**2021.07.26 දින පැවති ආයතන හා නීතිය පිළිබද ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු තීරණයන් ඒකමතිකව සහා සම්මත විය.**

**06(3) 2021.07.26 දින පැවති කර්මාන්ත හා ඉදිකිරීම් පිළිබද ස්ථාවර කමිටු වාර්තාවේ තීරණයන් සලකා බැලීම.**

<u>මහ නගර සභා මන්ත්‍රී - ඒ.ඒච්.සුදේශ් ඉන්ද්‍රජිත් කුමාර මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, අපිට දැනගන්නට ලැබුනා මොරටුව බල ප්‍රදේශයේ මාතෘසායන වල ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් යම් ප්‍රතිපාදනය ප්‍රමාණයක් වෙන් කර ඒවා ඇති බැවින් ඒවාට අදාල ඇස්තමේන්තු සකස් කරලා ඒවන්න කියලා. අපි කාටවත් අවබෝධයක් තිබුනේ නැහැ ඒ කුමන මාතෘසායනද ඒ සම්බන්ධ කිසිදු කටයුත්තක් සම්බන්ධව සභාවේ අපි දැනුවත් නැහැ. නමුත් අපිට පක්ෂයක් හැටියට පාර්ලිමේන්තු මන්ත්‍රී ප්‍රතිපාදන යටතේ යම් මුදල් ප්‍රමාණයක් වෙන්වුනා අපි ඒ මුදල බොරුපන මාතෘ සායනය ආරක්ෂිත වැටක් ඉදිකිරිම සහා වැහි ආවරණයක් ඉදිකිරිම වෙනුවෙන් අදාල යෝජනාව ඉදිරිපත් කරලා දැන් ගිය මාසේ 7 වෙනිදා අදාල යෝජනාව ඇස්තමේන්තු කැඳවන්න කියලා නගර සභාවට යොමු කරලා තියෙන්නේ ඒ ඇස්තමේන්තු සකස් කරලා ප්‍රාදේශිය ලේකම් කාර්යාලයට අද වෙනකම් ඉදිරිපත් කරලා නැහැ.අපිට තොරතුරු තියෙනවා හදපු ඇස්තමේන්තුව අතුලේ මේ සියලු සංවර්ධන කටයුතු තියෙනවා.බොරුපන සම්බන්ධව මම කියන්නේ. පාර්ලිමේන්තු ප්‍රතිපාදන වෙන් කලාට පස්සේ අපිට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය දැනුවත් කලෙත් නැහැ නගර සභාවෙන් දැනුවත් කලෙත් නැහැ හැබැයි මේ ප්‍රතිපාදන මේ විදියට දිග් ගැස්සිලා මේවා අහෝසි වෙන්න පුලුවන්. එම නිසා අපිට ඒ වෙනුවෙන් ප්‍රතිපාදනයට අදාල ඇස්තමේන්තුව හැකි ඉක්මනින් යවන්න කියලා ඉල්ලනවා. මෙය ඉක්මනින් කල නොහැකිනම් අපිව දැනුවත් කරන්න අපි වෙන යෝජනාවක් ඉදිරිපත් කරන්නම්.

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රිතුමා,යවලා තියෙන්නේ . පලාත් සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් අපිට ඒවලා තියෙනවා ඔය සඳහා ලක්ෂ 11 ක මුදලකුත්, විමල් වීරවංශ ගරු අමාත්‍යතුමා ලක්ෂ 7 1/2 එවලා තියෙනවා. අපි කරන්න යන වැඩසටහනට අපේ ඇස්තමේන්තුව සඳහා යන මුදලෙදි අපි ට වැඩිවීමක් වෙලා තියෙන්නේ. මෙතන වරදක් වෙලා තියෙන්නේ මෙතනයි. ඔබතුමන්ලා මින් ඉදිරියේදිවත් මේක කරන්න. මම ප්‍රාදේශිය ලේකම්ට ලිපියක් යවලා තියෙන්නේ නගර සභාවේ යම් කිසි තැනකට මුදල් වෙන්කිරිමේදි කරුනාකරලා නගර සභාවෙන් අහලා සභාවෙන් මුදල් වෙන්කිරිම කරන්න කියලා. හේතුව තමයි අපි ගරු මන්ත්‍රිවරුන්ගේ ඉල්ලිම් වලට සමහර වෙලාවට යම් යම් පාරවල්, කාණු, සෞඛ්‍ය මධ්‍යස්ථාන, ක්‍රිඩාංගන ඒ සියලු දේට මුදල් යොදවන අවස්ථා තියෙනවා. හැබයි මන්ත්‍රිවරයා මුදල් යොදවපු අවස්ථාවක් වුනාම මොන විදියකින් වත් කවුරු මුදල් එවුවත් අපිට ඒක කන්න බැහැ මොකද කොට්ඨාශයටම වගකියන මන්ත්‍රිවරු ඉන්නේ දැනට ස්ථපිත ආයතනයක් විදියට පලාත් පාලන ආයතනය පමණයි.එතකොට ඔවුන්ට වගකීම වැඩියි. නමුත් කලින් නම් මුදල් වෙන් කිරිම කරන්නේ ඇස්තමේන්තුවෙන් පස්සේ. මොකක් හෝ පටලැවිල්ලක් වෙලා. ඇස්තමේන්තුවන් පිලියෙල කරලා ම සතේටම ඒ මුදල එවන්න පුලුවන්. ඒ විදියට කලා

නම් මේක වෙන්නේ නැහැ. ඇස්තමේන්තුවක් පිලියෙල කිරිමේදි අනිවාර්යෙන් අපි මුදල් වෙන් කරලා හදනවානම් එතකොට ආයතනය කියනවා මේකට මුදල් වෙන් කරලා තියෙන්නේ ඒම නිසා මේකට අවශ්‍ය නැහැ කියලා. මේ පටලැවිල්ල බේර ගන්න ඕන මුල් අවධියේදි. අපි ඔබතුමන්ලොගේ ඒකට උත්තර යවලා තියෙන්නේ. ඒම නිසා අපි ඒක නිරවුල් කරගමු.

<u>මහ නගර සභා මන්ත්‍රි - ඒ.ඒච්.සුරේශ් ඉන්දික මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, ඒ කියන්නේ මේ ව්‍යාපෘති සඳහා සෞඛ්‍ය අංශයෙන් ඒවපු මුදලයි. ගරු විමල් වීරවංශ ඇමතිතුමා එවපු මුදලයි ඒ දෙකම ගත්තම වෙනස් කමක් තියෙනවා මේතුමන්ලා නම් කරලා තිබුනු ව්‍යාපෘතියත් ඒක්ක. බොරුපන මාතෘ හා ළමා සායනයේ ඒ ව්‍යාපෘතිය නම් කරලාම තමයි මුදල් වෙන් කරලා තිබුනේ. වැහි ආවරණයක් හදන්න සහ දැල් ගහන්න. ඒතකොට පලාත් සෞඛ්‍ය කාර්යාලයේ මුදල් සම්පූර්ණයෙන් ඇස්තමේන්තු කරලා ඉවරයි. ඒ කාර්්යයන්ම තමයි මෙතුමන්ලා නම් කරලා තිබුනේ. අපි කරලා තිබුනේ ගරු නගරාධිපතිතුමනි බොරුපන මාතෘ හා ළමා සායනය හ පෙර පාසැල් ගොඩනැගිල්ල සංවර්ධන කටයුතු කරන්න. සංවර්ධනය කටයුතු කියලාසඳහන් කර තිබුනා නම් ආවරණය වන ඕනෑම දෙයක් කරන්න පුලුවන් ඇස්තමේන්තුවෙන් මෙතනින් වෙලා තිබුනේ මෙතුමන්ලා නම් කරලම තිබුන නිසා වෙනත් දෙයකට ගන්න බැරි වුනා.

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රිතුමා, ඒක නිශාන්ත ගරු මන්ත්‍රීතුමා හොදටම දන්නවා මොකද ඒතුමන්ලාගේ මුදල් අඩුවුන වෙලාවේ මම විශේෂ කරලා සලකලා ඒ අඩුවන ප්‍රමාණයට ලක්ෂ 1-2 දිපු අවස්ථා තියෙනවා. ඒහෙම ප්‍රශ්ණයක් අපි දෙගොල්ලෝ අතර තියෙන්නේ බැහැ. මම නිවාර්්යයෙන්ම ඒහෙම නොකර ඉන්නවා නොවෙයි. වෙලා තියෙන්නේ දැන් මේකට මුදල් වැඩියි. ලක්ෂ 18 ක් තියෙනවා. මම ඒ ගැන කථා කරලා බේර ගමු.

<u>මහ නගර සභා මන්ත්‍රි - බී.සජිත් දුමින්ද පිරිස් මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, නිවැරදි කිරිමක් කරන්න ඕනා. අපි ගිය රජය කාලේ මුදලක් ඒවන්න කලින් විශේෂයෙන් මොරටුව නගර සභාවේ මාතෘ හා ළමා සායන හැදුවා. ටිජ්ල්සි පුස්තකාලයේ විද්‍යාල මාවතේ ඒකත් මෙතුමිය තමයි ඇස්තමේන්තු හැදුවේ . ඊට පස්සේ තමයි මුදල් ඒන්නේ. ඒක හදාගන්න පුලුවන් ඔබතුමාගේ රජයත් ඒක්ක කථා කරලා.

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රිතුමා, ඒ හැම සතයක්ම මහජනයා සඳහා වෙන් කරන කාර්යාලයේදි හොඳම කාර්ය තමයි අදාල ක්‍රියා පටිපාටිය ඒක මත කියාම ප්‍රශ්ණ මතුවෙන්නේ නැහැ. අපි ඒ විදියට ඊලහට කටයුතු කරමු.

2026.07.26 දිනැති පැවති කර්මාන්ත හා ඉදිකිරීම් පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම තීරණ ඒකමතිකම සහා සම්මත විය.

**06(4) 2021.07.26 දින පැවති මුදල් පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ තීරණයන් සලකා බැලීම.**

**<u>මහ නගර සභා මන්ත්‍රී - ඒම්.තිසර රසාංජන මෙන්ඩිස් මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි,මුදල් කමිටුවේ 9 වෙනි කාරනාව සම්බන්ධව ඔබතුමාගෙන් පැහැදිලි කිරීමක් බලාපොරොත්තු වෙනවා. වාර්තාවේ සඳහන් පරිදි ඇමුණුමක් ඉදිරිපත් කරලා නැහැ. ඒ වගේම ඒම දිනය පිළිබදව දැනගන්න කැමතියි. ඒක පෙර පැවති අධිහාරයට සම්බන්ධයිද කියලා තමයි දැනගන්න ඕන.

**<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රිතුමා, එය දෙකක්. අපි මාසිකව නොගෙවපු ඒකක් ගෙවන්න නිශ්චිත කර ගත්තු ඒකක් ගෙවන්න.

**<u>මහ නගර සභා මන්ත්‍රී - කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි,මුදල් කමිටුවවේ අංක 03, අංක 04, අංක 06, අංක 09 කරුනු වලට විරුද්ධයි. අනිත් ඒවාට පක්ෂයි. කොවිඩ් වලට අදාලව අවසන් කටයුතු සඳහා අපේ පැත්තෙන් කොපමණ වියදම් ප්‍රමාණයක් දරලද කියන එක දැනගන්න පුළුවන්ද ?

**<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රිතුමා, ඊලඟ මුදල් කමිටුවට ඉදිරිපත් කරන්නම්.

**<u>මහ නගර සභා මන්ත්‍රී - කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, මේ වෙලාවේ අපි හොඳටම දන්නවා හෙට දවසේ අපේ මූල්‍ය තත්වය යහපත් වෙන්නේ නැහැ. මූල්‍ය ලේඛණ අධ්‍යනය කලාම අපට පේනවා සභාවේ හෙට දවසේ බරපතල ප්‍රශ්ණයකට මුණ දෙන්න වෙනවා. ඒය වලක්වන්න බැහැ.ඒ නිසා අපේ පැත්තේ ඉල්ලීම තමයි අපි වියදම් දරද්දි අත්‍යවාශය වියදම් හඳුනා ගනිමින් තමයි අපි වියදම් දැරියයුත්තේ.මේ වාර්තාවේ තියෙනවා වැක්සින් ඒක ගහලා අපු කණ්ඩායමකට කරපු සංග්‍රහයක් යෝගට්, කිරි පැකට් අපිට ඒකට විරුද්ධ වෙන්න බැහැ. අපි සමත් වුනානම් ආයතනය සොයාගෙන ඒය පාවිච්චි කරන්න. අවසානයේ ඒකතුව ලක්ෂ ගානක් වෙනවා. මේ ආයතනය මේහෙම වියදම් දරන ඒක යම් ප්‍රමාණයකට හෝ වලක්වා ගනිමින් කටයුතු කරනවා නම් හොඳයි. අපි මිලියන 5 කට වැඩියෙ මාසෙකට ණය සහ පොලි වාරික ගෙවන්න ඕනා. අපි දේශපාලන වශයෙන් ඒකඟ නැහැ ඒකට. නමුත් ඔබතුමාට අවධාරණය කරන්නේ අත්‍යාවශ්‍ය දේයට පමණක් වියදම් කරන්න ඒක තමයි අපිට මේ වෙලාවේ ඉල්ලන්න තියෙන්නේ.

**<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ඔබතුමා කියන ඒකට අවධානය යොමු කරනවා .මම හිතන්නේ පහුගිය කාලයේ කොරෝනා වසංගතයත් ඒක්ක අපිට පුලුවන්කමක් නැති වුනා ව්‍යාපාරිකයන් ලගට ගිහිල්ලා මේ ඉල්ලීම කරන්න. ව්‍යාපාරිකයන් කොරෝනාත් ඒක්කම යම් කිසි පසුබැමක සිටියේ. අපිට මොන විදයකටවත් මැලිබන් ඒකට කථාකරගන්න බැරි වුනා. යෝගට් ඒකටත් ඒහෙමයි. ඒගොල්ලොත්

ව්‍යාපාරික වශයෙන් වැටිලා නිසා. නැත්නම් ඔබතුමා දන්නවා මේ වගේ වැඩක් කරන්න ගියාම මම මුලින්ම කථා කරන්නේ ව්‍යාපාරිකයින්ට. ව්‍යාපාරිකයින් වටිම නිසා තමයි අපි ව්‍යාපාරික බලපත්‍රය 2021 දි සම්පූර්ණයෙන්ම අයින් කරලා දැම්මේ. ඔබතුමාගේ අදහසට අපි ගෞරවනීය ස්තුතිට පුදකරනවා.

<u>මහ නගර සභා මන්ත්‍රී - යූ.ප්‍රසන්න මනෝජ් ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, පොඩි පැහැදිලි කර ගැනිමක් 20 (1), (2), (3), (4) එන්නත් කරනයේදි යෝගට් හා පානිය ජලය ලබා දීම සම්බන්ධව. ඒකට විරුද්ධත්වයක් නැහැ හොඳ දෙයක්.ලබාගත් ඩී.එම්.එන් ආයතනයෙන් තුන්වරක් අරගෙන තියෙනව එකවරකදි 26.50කට, ඊට පසුව රු. 26/- ශත 50 ක වෙනසක් තියෙනවා. ඒ වගේම පිග්ගි කියලා නාවල ආයතනයකින් ඒ ආයතනය තෝරා ගත්තේ කොහොමද කියලා.

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රිතුමා, ස්ටොක් ගන්න අවස්ථාවලදි අපිට ගන්න ඕනා ප්‍රමාණය ගන්න බැරි වුනාම ඒ අවස්ථාවලදි ඒ ප්‍රමාණය තිබෙන තැන් වලට ගිහිල්ලා අපට ඒවා ගන්න වුනා. ඒක තමයි හේතුව.

<u>මහ නගර සභා මන්ත්‍රී - යූ.ප්‍රසන්න මනෝජ් ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි,ශත 50 ක වෙනසක් තියෙනවා. ඒකම ආයතනයේ මිලදී ගැනිමේදි. ඒ ගැන දැනගන්න කැමතියි.

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රිතුමා, යම් විදියකින් නිලධාරියෙක් ගිහින් කථා කරන කොට රු. 26.50 ඒකම මන්ත්‍රිවරයෙක් ගිහිල්ලා කථා කරනකොට ශත 50 අඩු වෙනවා. ඒක තමයි හේතුව.

<u>මහ නගර සභා මන්ත්‍රී - යූ.අනුරසිරි ජේ ද සිල්වා මහතා</u>

ගරු නගරාධිපතිතුමනි,මුදල් කමිටු වාර්තාවේ 9 වන අයිතමයට විරුද්ධයි. අනිත් ඒවට පක්ෂයි.

2021.07.26 දින පැවති මුදල් පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු තීරණයන්ට පක්ෂව පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරු ඡන්දය ප්‍රකාශ කරන ලදී.

1. නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා
2. මහා නගර සභා මන්ත්‍රී - ජී.එම්.සුරංග නිශාන්ත අපෝන්සු මහතා
3. මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා
4. මහා නගර සභා මන්ත්‍රී - එම්.තිලකසිරි ප්‍රනාන්දු මහතා
5. මහා නගර සභා මන්ත්‍රී - එච්.ප්‍රදීප් ශ්‍රියන්ත ප්‍රනාන්දු මහතා
6. මහා නගර සභා මන්ත්‍රී - එල්.ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා
7. මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්.සුරේෂ් ඉන්දික මහතා
8. මහා නගර සභා මන්ත්‍රී - යු.සුදත් ක්‍රිෂාන්ත පෙරේරා මහතා
9. මහා නගර සභා මන්ත්‍රී - ඩී.ඩබ්.ඩී.රන්දු නිරෝෂණ මහතා
10. මහා නගර සභා මන්ත්‍රී - එම්.නාලනී ප්‍රේමවතී ප්‍රනාන්දු මහත්මිය
11. මහා නගර සභා මන්ත්‍රී - පී.අශෝක ඉන්ද්‍රතිලක ප්‍රනාන්දු මහතා

12. මහා නගර සභා මන්ත්‍රී - පී.එම්.මහේෂ් රුක්මාල් ඩයස් මහතා
13. මහා නගර සභා මන්ත්‍රී - පී.යසන්ත රන්සිරි ප්‍රනාන්දු මහතා
14. මහා නගර සභා මන්ත්‍රී - එස්.ඩබ්.එම්.නිෂා ඉරානි විජේවික්‍රම මහත්මිය
15. මහා නගර සභා මන්ත්‍රී - කේ.ඩී.අනුර ප්‍රනාන්දු මහතා
16. මහා නගර සභා මන්ත්‍රී - යූ.ලලිත් ප්‍රනාන්දු මහතා
17. මහා නගර සභා මන්ත්‍රී - එස්.බේසර රවීන්ද්‍ර ප්‍රනාන්දු මහතා
18. මහා නගර සභා මන්ත්‍රී - එෆ්.බී.නිලංක සිල්වා මහතා
19. මහා නගර සභා මන්ත්‍රී - එම්.කේ.පී සුසන්ත පෙරේරා මහතා
20. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ප්‍රිනිත් ක්‍රිෂාන්ත විජේරත්න මහතා
21. මහා නගර සභා මන්ත්‍රී - එම්.පිලිප් ෆැන්සිස් ප්‍රනාන්දු මහතා
22. මහා නගර සභා මන්ත්‍රී - එම්.ජයමාල් ශ්‍රියාරත්න මහතා
23. මහා නගර සභා මන්ත්‍රී - එම්.බී.මල්ලිකා ජයවතී ප්‍රනාන්දු මහත්මිය

2021.07.26 දින පැවති මුදල් පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ අංක 09ට විරුද්ධවත් අනෙකුත් සියලුම කමිටු තීරණයන්ට පක්ෂවත් පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරු ඡන්දය ප්‍රකාශ කරන ලදී.

1. මහා නගර සභා මන්ත්‍රී - රවිනාත් ජයශ්‍රී ගුණසේකර මහතා
2. මහා නගර සභා මන්ත්‍රී - බී.සජිත් දුමින්ද පීරිස් මහතා
3. මහා නගර සභා මන්ත්‍රී - එම්.තිසර රසාංජන මෙන්ඩිස් මහතා
4. මහා නගර සභා මන්ත්‍රී - යූ.අනුරසිරි ජයලාල් ද සිල්වා මහතා
5. මහා නගර සභා මන්ත්‍රී - ආර්.එම්.ඒ.දෝන දිලාශිනී මහත්මිය
6. මහා නගර සභා මන්ත්‍රී - යූ.ප්‍රසන්න මනෝජ් ප්‍රනාන්දු මහතා
7. මහා නගර සභා මන්ත්‍රී - ජී.එම්.නිරෝෂන් රුවමාල් අපෝන්සු මහතා
8. මහා නගර සභා මන්ත්‍රී - එම්.සුදර්ශනි ප්‍රියන්ත්‍රිකා කුරේ මහත්මිය
9. මහා නගර සභා මන්ත්‍රී - මේරියන් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය
10. මහා නගර සභා මන්ත්‍රී - සිත්ති මසීනා බක්කර් මහත්මිය
11. මහා නගර සභා මන්ත්‍රී - එම්.ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මිය
12. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ශ්‍රියානි හේමලතා ප්‍රනාන්දු මහත්මිය
13. මහා නගර සභා මන්ත්‍රී - ආර්.ක්‍රිෂනි ප්‍රනාන්දු මහත්මිය

2021.07.26 දින පැවති මුදල් පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ අංක 03,04 ,06,09 යන කරුණු වලට විරුද්ධවත් අනෙකුත් සියලුම කමිටු තීරණයන්ට පක්ෂවත් පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරු ඡන්දය ප්‍රකාශ කරන ලදී.

1. මහා නගර සභා මන්ත්‍රී - කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා
2. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.පී.ප්‍රභාෂනි වික්‍රමසිංහ මහත්මිය
3. මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්.සුදේෂ් ඉන්ද්‍රජිත් කුමාර මහතා

2021.07.26 දින පැවති මුදල් පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු තීරණයන් වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.

(මේ අවස්ථාවේදී මහා නගර සභා මන්ත්‍රී, පී.ගාවින් මත්තෙස් මහතා සභා ගැබෙහි නොසිටියහ.)

07. <u>ලැබීම් ගෙවීම් පිළිබඳ මාසික ප්‍රකාශන වැඩ ප්‍රගති වාර්තාව</u>

**<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මහ නගර සභා මන්ත්‍රීවරුනි2021.07.26 මුදල් කමිටු වාර්තාවේ අංක 04 යටතේ 2021 ජූනි මාසයට අදාල මූල්‍ය වාර්තාව ඇමුණුම - 01 ලෙස ඉදිරිපත් කර තිබෙනවා.

08. <u>පුද්ගලික ස්වාභාවයේ කරුණු</u> - නැත.

09. <u>වෙනත් කරුණු</u> - නැත.

සභාවේ වැඩ කටයුතු මෙතනින් අවසන් විය.

අ.කලේ/ ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු
නගරාධිපති,
මොරටුව මහා නගර සභාව,
මොරටුව.

2021.08.05 දින,
මොරටුව මහා නගර සභා කාර්යාලයේදිය.